

# සුබ සාධනයෙහි ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය මානයන් පිළිබඳ සංසන්දනාත්මක විමර්ශණයක්

## ශ්‍රී ලංකාවේ බදුල්ල දිස්ත්‍රික්කය තුළ සිදු කරන ලද ගවේෂණාත්මක අධ්‍යයනය

**සංජීවනී කාරියවසම්**

සැප්තැම්බර් 2013
කාර්ය පත්‍රිකා මාලා අංක 20 - 2013

cepa
centre for poverty analysis

# සුබ සාධනයෙහි ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය මානයන් පිළිබඳ සංසන්දනාත්මක විමර්ශණයක්

ශ්‍රී ලංකාවේ බදුල්ල දිස්ත්‍රික්කය තුළ සිදු කරන ලද
ගවේෂණාත්මක අධ්‍යයනය

සංජීවනී කාරියවසම්

සැප්තැම්බර් 2013

කාර්ය පත්‍රිකා මාලා අංක 20 - 2013

© දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය 2013

ප්‍රථම මුද්‍රණය - 2013

ISBN : 978-955-1040-70-3

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය - ප්‍රකාශනගත සුචිකරණ දත්ත

කාරියවසම්, සංජීවනී
සුබ සාධනයෙහි ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය මානයන් පිළිබඳ සංසන්දනාත්මක
විමර්ෂණයක් : ශ්‍රී ලංකාවේ බදුල්ල දිස්ත්‍රික්කය තුළ සිදු කරන ලද ගවේෂණාත්මක අධ්‍යයනය
/ සංජීවනි කාරියවසම් කොළඹ : දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය, 2013
පිටු 34 සෙ.මී. 29 (කාර්ය පත්‍රිකා මාලා ; අංක 20)

ISBN : 978-955-1040-70-3

(i) 362.509549 ඩීවී 23 (ii) ග්‍රන්ථ නාමය

(iii) ග්‍රන්ථ මාලාව

1. දරිද්‍රතාවය - ශ්‍රී ලංකාව

මෙම ග්‍රන්ථයේ ප්‍රකාශන අයිතිය සේපා ආයතනය සතු වේ. කර්තෘ/කර්තෘන් හා ග්‍රන්ථ ප්‍රකාශනයේ අවසරය ඇතිව මෙම ග්‍රන්ථයේ ඕනෑම කොටසක් පිටපත් කළ හැකිය.

සේපා ප්‍රකාශන මාලාවට: අධ්‍යයනයන් සංස්කරණය කරනු ලැබූ වෙළුම, කාර්ය පත්‍රිකා මාලාවන් හා සංක්ෂිප්ත අධ්‍යයනය පත්‍රිකා අයත් වේ. මෙම කාර්ය පත්‍රිකා මාලාවෙන් ඉදිරිපත්වන අර්ථකථනයන් සහ නිගමනයන් එම කර්තෘන්ගේ අයිතියට යටත්වන අතර සේපා ආයතනයේ හෝ ග්‍රන්ථ අනුග්‍රහකයන්ගේ මතය හෝ ප්‍රතිපත්ති මතු නොකරයි.

මෙම ග්‍රන්ථයේ යොදාගෙන ඇති ඡායාරූප සේපා කාර්ය මණ්ඩලයට අයත් වේ.

මෙම ප්‍රකාශණය සම්බන්ධ සියලු විමසීම් පහත සඳහන් ලිපිනයට යොමු කරන්න:
දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය
29, ආර්. ජී. සේනානායක මාවත,
කොළඹ 07,
ශ්‍රී ලංකාව.
දුරකථන : +94 (011) 2676955, 4690200
ෆැක්ස් : +94 (011) 2676950
විද්‍යුත් තැපෑල: info@cepa.lk
www.cepa.lk

මුද්‍රණය:
සී/ස. මුද්‍රණ ප්‍රින්ටර්ස් (පෞද්) සමාගම
කොළඹ.

**සංජීවනී කාරියවසම්** මෙනවිය දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයෙහි දරිද්‍රතා ඇගයීම් සහ මිනුම් වැඩ සටහනෙහි නියැළුනු සංඛ්‍යාන විද්‍යාව පිළිබඳ විශේෂඥතාවයකින් යුතු වෘත්තිමය පර්යේෂිකාවකි. ඇය සමාජ සංඛ්‍යානය ඇතුළුව ආර්ථික විද්‍යාව පිළිබඳ අධ්‍යයනය කර ඇති අතර දැනට මොරටුව විශ්ව විද්‍යාලයේ ව්‍යාපාරික සංඛ්‍යානය පිළිබඳ විද්‍යාපති උපාධිය හදාරයි. ඇය දරිද්‍රතා ඇගයීම් සහ මිනුම් කටයුතු සඳහා අධ්‍යයනයන් සැලසුම් කිරීම, දත්ත එක් රැස් කිරීම, විශ්ලේෂණය කිරීම හා වාර්තා කිරීම තුලින් දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයට තම දායකත්වය සපයයි. ඇය විසින් බහුමාන දිළිඳුකම හා සුබ සාධනය පිළිබඳ පර්යේෂණ සහ උපදේශකත්වය සඳහා මහඟු දායකත්වයක් ලබා දී ඇත. ඇය ප්‍රායෝගික සංඛ්‍යානය, ජාත්‍යන්තර වෙළඳ හා මූල්‍ය කටයුතු, ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ පර්යේෂණ ක්‍රමවේද යන ක්ෂේත්‍රයන් පිලිබඳව උනන්දුවක් දක්වයි.

**දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය** (CEPA) දරිද්‍රතාවය හා සම්බන්ධ සංවර්ධන ගැටළු පිළිබඳව යථා අවබෝධය ප්‍රවර්ධනය කිරීමෙහිලා කැප වූ ශ්‍රී ලාංකීය ස්වාධීන ආයතනයකි. සේපා ආයතනය තුළ අපගේ අවධානය යොමු වනුයේ ස්වාධීන විශ්ලේෂණය, සංවර්ධන ක්‍රියාකරුවන්ගේ හැකියා වර්ධනය සහ ප්‍රතිපත්ති සඳහා බලපෑම් කිරීමට අවස්ථා සොයා බැලීම වේ. වෙළඳපොල අවශ්‍යතාවන්ට ප්‍රතිචාර දක්වන අතරම කාලීන ප්‍රයෝගික පරීක්ෂණ මත පදනම් වූ සේවා සැපයීම කෙරෙහි අප ආයතනය ප්‍රබල ලෙස යොමු වී ඇත. සේපා ආයතනය මෙම වෙළඳපොළ හැඩගැස් විම පවත්වාගනු ලබන්නේ සේවා දායකයින්ගේ ඉල්ලීම් මත මෙන්ම යුධ ගැටුම් වලින් පසු සංවර්ධනය, අවදානම් තත්ත්වයන්, සංක්‍රමණය, පොදු පහසුකම් හා පරිසරය වැනි පුළුල් තේමා පහක් යටතේ සිදු කරනු ලබන සමාන්තර ස්වාධීන පර්යේෂණ අධ්‍යයනයන් තුළිනි.

# ස්තූතිය

මෙම පත්‍රිකාව දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA) විසින් ආර්ථික ප්‍රතිපත්තීන් පිළිබඳ සහයෝගීතා ආයතනයේ (PEP)[1] මූල්‍යාධාර ඇතිව සිදු කරන ලද දිළිඳුකම පිළිබඳ බහුමාන විශ්ලේෂණයක ප්‍රතිඵල මත පදනම්ව ඇත. මෙම පර්යේෂණය සඳහා භාවිතා කළ ප්‍රශ්නාවලිය ඔක්ස්ෆර්ඩ් දිළිඳුකම හා මානව සංවර්ධන උත්සාහයන් (OPHI)[2] ආයතනය විසින් සංවර්ධනය කරන ලද අවධානයෙන් බැහැර වූ මානයන් පිළිබඳ වැඩසටහනෙන් උපුටාගෙන යෝග්‍ය ලෙස සකස් කර භාවිතා කරන ලදී. මෙම සමීක්ෂණය යටතේ දත්ත රැස් කිරීම, කුටුම්භ සමීක්ෂණ ඉලක්ක කණ්ඩායම් සමග සාකච්ඡා පැවැත්වීම, ප්‍රධාන පුද්ගලයින් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීම සහ ඒ සඳහා දායක වූ සේපා ආයතනයේ සමීක්ෂක කණ්ඩායම මෙන්ම මෙම පත්‍රිකාවේ දළ පිටපත් සඳහා තම විවේචන ඉදිරිපත් කළ සැමට කතුවරිය සිය කෘතඥතාවය පළ කරයි.

මෙම පත්‍රිකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවිය දෘෂ්ඨිකෝණයෙන් විමර්ෂණය කළ සේපා ආයතනයේ විධායක අධ්‍යක්ෂිකා ප්‍රියන්ති ප්‍රනාන්දු මහත්මියටද, න්‍යායික හා නිර්මාණාත්මක විවේචන ඉදිරිපත් කළ ජ්‍යෙෂ්ඨ පර්යේෂිකා නිලක්ෂි ද සිල්වා මහත්මියටද, සියලුම දළ පිටපත් සංස්කරණය කර අවසන් පිටපත සකස් කිරීමට දායකත්වය දැක් වූ සංස්කාරිකා රොෂ්නි අලස් මහත්මියටද කතුවරිය සිය විශේෂ ස්තූතිය පුද කරයි. මෙහි පවත්නා දෝෂ සහ අත්හැරුනු කරුණු පිළිබඳ ඔවුන් කිසිදු වගකීමක් දරනු නොලැබේ.

මෙම පත්‍රිකාව සිංහල බසට පරිවර්තනය කළ වජිරා පතිරණ මහත්මියටද කතුවරිය සිය කෘතඥතාවය පලකරයි.

එසේම මෙම පත්‍රිකාව මුද්‍රණය කිරීමට සහ සිංහල හා දෙමළ බසට පරිවර්තනය කිරීමට සහයෝගය දුන් ආසියා පදනම ආයතනයට ද කතුවරිය සිය කෘතඥතාවය පලකරයි.

[1] පී.ඊ.පී (PEP) පිළිබඳ වැඩි විස්තර සඳහා www.pep-net.org වෙබ් අඩවියට පිවිසෙන්න.

[2] "දිළිඳු බවේ අවධානයෙන් බැහැර වූ මානයන්" පිළිබඳ වැඩි විස්තර සඳහා www.ophi.org.lk වෙබ් අඩවියට පිවිසෙන්න

# පටුන


| | | |
|---|---|---|
| ප්‍රස්තාවනාව | | vii |
| 1. | හැඳින්වීම | 1 |
| 2. | මානසික සුබ සාධනය සහ එහි මිනුම් දඬු | 3 |
| 3. | අධ්‍යයනයේ න්‍යායික රාමුව සහ ක්‍රමවේදය පිළිබඳ විමසුමක් | 5 |
| 4. | ප්‍රතිඵල | 9 |
| 5. | සාකච්ඡාව සහ සබඳතාවය | 15 |
| 6. | නිගමනය | 17 |
| ආශ්‍රිත ග්‍රන්ථ | | 19 |
| ඇමුණුම් | | 21 |

## ප්‍රස්තාවනාව

මෙම පත්‍රිකාවෙන් ශ්‍රී ලාංකික සන්දර්භය තුළ මනෝවිද්‍යාත්මක සහ පුද්ගල නිශ්‍රිත සුභසාධනය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය අතර ඇති සබඳතාවය පිළිබඳ විමසා බලයි.

සංවර්ධනයෙහි අවසන් ඉලක්කය ලෙස නිතරම සලකා බලනුයේ සතුට සහ සුභසාධනය වේ. ඉතා අවම ආදායම් මට්ටම් වලට වඩා ඉහල මට්ටම් තුළ දී සතුට සහ ආදායම අතර සබඳතාවක් නොමැති බව බොහෝ අධ්‍යයනයන්ගෙන් හෙලි වී ඇති කරුණකි. එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රතිපත්ති සම්පාදකයින් සහ පර්යේෂකයින් අතර සුබ සාධනයෙහි ද්‍රව්‍යමය නොවන මානයන් පිළිබඳ ව සොයා බැලීමේ දැඩි උනන්දුවක් දක්නට ලැබේ. ආදායම සහ පරිභෝජනය මත පදනම්ව සුබ සාධනය පිළිබඳ මැනීම ප්‍රමාණවත් නොවන බව සම්බන්ධයෙන් දැනුවත්භාවය වර්ධනය වෙමින් පවතින අතර ඒ හේතුවෙන් සුබ සාධනය පිළිබඳ සෘජුවම මැන බැලීමේ උනන්දුවක් පවතී. බොහෝ විට සතුට පිලිබඳ සෘජු ප්‍රශ්න විමසීමේ ක්‍රමය මේ සඳහා අනුගමනය කරයි. දිළිඳුකම පිළිබඳ බහුමාණ විශ්ලේෂණයේ දී කලක් මුළුල්ලේ ඉස්මතු වුන ආර්ථික දර්ශක භාවිතයේ සිට සමාජ දර්ශක දක්වාද, ඉන්පසු මානසික සුබ සාධනය වැනි දිළිඳුකමේ මනෝවිද්‍යාත්මක දර්ශක රාශියක්ද හඳුනාගෙන ඇත. කෙසේ වුවද, දිළිඳුකමේ සංකීර්ණභාවය අවබෝධ කරගැනීම සඳහා පුද්ගල/ගෘහ මට්ටමේ සංසන්දනාත්මක දත්ත ජාත්‍යන්තර මට්ටමේ පවා හිඟයක්ව පවතී. එසේම සතුට මැන බැලීම පිණිස සමීක්ෂණයන් සැලසුම් කිරීමේ ක්‍රමවේදය පිළිබඳ බොහෝ බාධක වලට මුහුණ දීමට සිදුවේ. ප්‍රධානම බාධකය වූයේ ප්‍රතිචාරවල පැහැදිලි ශක්තිමත් භාවයක් නොමැති වීමය.

ඔක්ස්ෆර්ඩ් දිළිඳුකම හා මානව සංවර්ධන උත්සාහයන් (OPHI) ආයතනය විසින් සංවර්ධනය කරන ලද සමීක්ෂණ මොඩියුලයක පුද්ගල නිශ්‍රිත මෙන්ම මනෝවිද්‍යාත්මක හෝ මානසික සෞඛ්‍යය පිළිබඳ දර්ශක ශ්‍රී ලංකාවේ බදුල්ල දිස්ත්‍රික්කයෙහි නියමු අධ්‍යයනයක් ලෙස භාවිත කරන ලදි. මෙම මොඩියුලය ප්‍රබල ලෙස ශ්‍රී ලාංකික සන්දර්භය තුළ සුභ සාධනය පිළිබඳ මානයන් අවබෝධ කර ගැනිමට හා මැන බැලීමට අවශ්‍ය වටිනා දත්ත සමූහයකින් සමන්විත බව පෙනේ.

මෙම අධ්‍යයන වාර්තාවෙහි සමීක්ෂණ දත්ත තුළින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ සුභ සාධනය අතර ඇති සබඳතාවය පිළිබඳව අවධානය යොමු කරයි. මෙම සමීක්ෂණයෙහි ප්‍රතිඵල තුලින් බදුල්ල දිස්ත්‍රික්කයෙහි ජනගහනයෙන් 97% පමණ මානසික සෞඛ්‍යය අතින් සතුටුදායක තත්වයක සිටින බව අනාවරණය විය. එහෙත් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය විසින් මානසික සුභ සාධනය අත් දකින ආකාරය පිළිබඳ පැහැදිලි වෙනසක් ඇති බව හෙළිදරව් වේ. පුරුෂ පක්ෂයට වඩා ස්ත්‍රී පක්ෂය මානසික සමබරතාවකින් යුතු බවත් පුද්ගල නිශ්‍රිත සුභ සාධනය පුරුෂයින්ට වඩා අවම මට්ටමකින් ඔවුන් වාර්තා කර ඇති බවත් මෙම අධ්‍යයනය ඉස්මතු කර දක්වයි. කාන්තාවන් තුළ අසතුටුභාවයට මූලික හේතුව වී ඇත්තේ පවුලේ සමාජ, ආර්ථික සාධක, ආදායම, රැකියා තත්වය මෙන්ම දරුවන් පිළිබඳ සාධක වේ. පුරුෂ පක්ෂයේ අසතුටුභාවයට මූලික හේතුව වී ඇත්තේ රැකියාව බව අධ්‍යයනයෙන් හෙලි විය.

ශ්‍රී ලංකාවේ මානසික සුභ සාධනය සම්ප්‍රදායික ස්ත්‍රී පුරුෂ සමාජභාවිය කාර්ය භාරය සහ අපේක්ෂාවන් සමග සබඳතාවයක් විය හැකි බව මෙම අධ්‍යයනය මගින් ඉදිරිපත් කරයි. මෙම වෙනස්කම් සමාජානුයෝජනය කෙරෙහි බලපාන අන්දම මෙන්ම පුරුෂයන් හා ස්ත්‍රීන් අත් විඳින සතුට සඳහා එහි බලපෑම සිදුවන ආකාරයද මෙම අධ්‍යයනයෙන් ඉස්මතු කර දක්වයි. ශ්‍රී ලාංකික ජන සමාජය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවිය කාර්යභාරය හා අපේක්ෂාවන් පිළිබඳව පැහැදිලි කිරීමට හා සාකච්ඡා කිරීමට මෙම පත්‍රිකාව උත්සහ දරයි.

# 1. හැඳින්වීම



ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංකල්පය ස්ත්‍රී පුරුෂ භාවය හෙවත් ලිංග භේදයට වඩා වෙනස් වේ. ස්ත්‍රීන්ගේ කායික හා කායික විද්‍යාත්මක අංග ලක්ෂණයන්හි ඇති වෙනස්කම් ස්ත්‍රී පුරුෂභාවය හෙවත් ලිංගභේදය ලෙස නිර්වචනය කරයි. (කුම්බා, 2001, පිටු අංක 9) ඊට හාත්පසින්ම වෙනස් අන්දමින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය යනු විශේෂිත වූ සමාජ සන්දර්භයක් තුළ ස්ත්‍රීන්ගෙන් හා පුරුෂයින්ගෙන් සමාජය අපේක්ෂා කරන ගති ලක්ෂණ, සමාජ සම්මතයන් සහ හැසිරීම් රටා වැනි සමාජය විසින් නිර්මාණය කරන ලද්දකි. (කුම්බා, 2001, පිටු අංක 9) ස්ත්‍රීන් හා පුරුෂයින් අතර ඇති මෙම වෙනස්කම් ඕනෑම සමාජයක් තුළ ආර්ථිකය, ආගමික, දේශපාලන ක්‍රමය, අධ්‍යාපනය සහ සංස්කෘතිය වැනි සුභ සාධනය පිළිබඳ වූ මානයන් තුළ ක්‍රියාත්මක වේ. එසේම මෙය ගෝත්‍රය, ජාතිය, පන්තීන් සහ ලිංග භේදය වැනි සමාජයේ පවතින අනෙකුත් වෙනස්කම් සමග අන්‍යොන්‍ය සබඳතාවක් දක්වයි. (කුම්බා, 2001, පිටු අංක 9)

සුබ සාධනය පිළිබඳ සංකල්පයද එලෙසම සංකීර්ණ වූ සංකල්පයකි. මෙම සුබ සාධනය පිළිබඳ මැනීම හා තක්සේරු කිරීම විවිධාකාරයෙන් සිදු කරන ලද නිර්වචනයන් මත පදනම්ව ඇත. (රයන් සහ ඩෙසි, 2001). සමහර විද්වතුන් විසින් සුභ සාධනය යනු මනෝවිද්‍යාත්මක සෞඛ්‍ය සම්පන්නභාවය හෝ හොඳ මානසික තත්වයක් ඇති ජීවිතයක් වශයෙන් හඳුනාගෙන ඇති අතර එය ද්‍රව්‍යමය සුභ සාධනය වැනි අනෙකුත් ප්‍රවේශවලින් වෙනස් වේ. (හෝරි, 2010). තමා සතු ද්‍රව්‍යමය වස්තූන් හෝ එම ද්‍රව්‍ය පරිභරණය කිරීම තුළින් පුද්ගලයන් තම අභිප්‍රායන් ඉටු කර ගැනීම හෝ එම ද්‍රව්‍ය පරිභරණය කිරීමෙන් එම පුද්ගලයා ලබන සතුට හෝ තෘප්තිමත්භාවය පිළිබඳ අභිලාශය මත ද්‍රව්‍යයමය සුභ සාධනය පදනම් වේ. (සේත් සහ හැරිස්, 1998). සුබ සාධනය පිළිබඳ සාකච්ඡාවන්හි වර්ධනය වෙමින් පවතින විවේචන වනුයේ සුබ සාධනය ද්‍රව්‍යයමය සුබ සාධනයට සීමා නොවිය යුතු බවත්, ඕනෑම ද්‍රව්‍යයමය සුබ සාධනයක අවසන් ප්‍රතිඵලය වන්නේ ද්‍රව්‍යමය නොවන සුබ සාධනය බවත් වේ. (සමන්, 2007)

මානසික සුබ සාධනය පිළිබඳ ස්ත්‍රී පුරුෂ සමාජභාවිය වෙනස්කම් පවතින බව අධ්‍යයනයන් මගින් හෙළිදරව් වේ. (අම්බර්සන් සහ අනිකුත් අය, 1990, පිටු 837-857). නිදසුනක් ලෙස ස්ත්‍රීන් හා පුරුෂයින්ගේ මානසික සුබ සාධනය කෙරෙහි සබඳතා දෙයාකාරයකින් බලපාන බව හෙළි වී ඇත. අම්බර්සන් සහ අනිකුත් අය, (1996) දී පෙන්වා දී ඇති පරිදි ස්ත්‍රීන් හා පුරුෂයන්ගේ සබඳතා කෙරෙහි සමාජ සහයෝගය[3] සහ සමාජ සමෝදානයෙහි[4] වෙනස් වූ බලපෑම් ඇත. ස්ත්‍රීන් හට පුරුෂයින්ට වඩා පුළුල් සමාජ ජාලයක්[5] ඇති බව

[3] සමාජ සහයෝගය - තමා සැලකිල්ලක් දක්වන අය පිළිබඳ තත්ත්වාකාරයෙන් හඳුනා ගැනීම, අනෙකුත් පුද්ගලයන්ගෙන් සහයෝගය ලබා ගත හැකි වීම, තමාද සමාජ ජාලයන්හි ඇතුළත් වීම, යන කරුණුය. මෙම සහයෝගිතා සම්පත් හැඟුම්බර/සංවේදී (උදා. රැකබලා ගැනීම) නිශ්චිතව දැනෙන සහයෝගයන් (මූල්‍ය සහයෝගය), තොරතුරු (උදා: අවවාද) හෝ සුමිතුරුකම (තමා සතු බව හැඟීම) වේ.

[4] සමාජ සමෝධානය යනු සමාජයේ පුද්ගලයන් හෝ ක්‍රියාකරුවන් එකිනෙකට සම්බන්ධව කටයුතු කිරීමේ මූලධර්මය වේ.

[5] සමාජ ජාලයන් - එනම් එක් එක් සබඳතා මත ගොඩනැගුන සමාජ ව්‍යුහයන් වේ. එනම් සමාජයේ ක්‍රියාකරුවන් පිරිසකගෙන් සැදුම්ලත් සමාජ ව්‍යුහයකි.

සමහර අධ්‍යයනයන්ගෙන් අනාවරණය වී ඇත. එහෙත් මෑතදී සිදු කළ අධ්‍යනයන්ගෙන් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේම සමාජ ජාල සමානතාවක් දක්වන බව හෙලි වේ. (වෙරොෆ් කුලිකා ඩොැවාන් (1981) අම්බර්සන් සහ අනිකුත් අය විසින් උපුටාගෙන ඇති පරිදි (1996) අපූර්ව ලෙස ස්ත්‍රීන් බොහෝවිට හැඟුම්බර, ඉඟියෙන් සිදුකරන සබඳතාවලට රුචිකත්වයක් දක්වන බවත් පුරුෂයන් විධිමත් සමිති සමාගම් සමග සබඳතා පවත්වන බවත් සමහර අධ්‍යයනයන්ගෙන් වාර්තා වේ. (මුවර්ගේ ප්‍රකාශනය 1990, අම්බර්සන් හා අනිකුත් අය විසින් 1996 දී උපුටා දක්වා ඇති පරිදි) තමා සමග එකට සිටින සේවකයින්ගෙන්, මිතුරන් හා පවුලේ සාමාජිකයින්ගෙන් ස්ත්‍රීන් හට පුරුෂයින්ට වඩා සහයෝගයක් ලැබෙන බවද එහෙත් පිරිමින්ට සාපේක්ෂව ස්ත්‍රීන් විෂාදයෙන් පෙළෙන බවද මෙම අධ්‍යයනයෙන් හෙළිදරව් වේ. මෙය සම්ප්‍රදායානුකූල ස්ත්‍රී පුරුෂ සමාජභාවිය කාර්යභාරයන් හා අපේක්ෂාවන් නිසා සිදුවිය හැකි බව අදහස් කරයි.[6] (රොසන්ෆීල්ඩ් 1980) ස්ත්‍රීන්ගේ කාර්යභාරයන් හා වගකීම් සඳහා නිතරම බොහෝ ඉල්ලුමක් ඇති වුවද පිරිමින්ගේ කාර්යභාරයන්ට වඩා අඩු ප්‍රතිලාභයන් කාන්තාවන්ට හිමිවන බැවින් ඔවුන් විෂාදයට පහසුවෙන් ගොදුරුවන බව බොහෝ අධ්‍යයනයන් ඉස්මතු කර දක්වයි. (අම්බර්සන් සහ අනිකුත් අය 1996 පිටු අංක 837 - 857) ස්ත්‍රීන් හා පුරුෂයන් සමාජානුයෝජන[7] ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස තව දුරටත් මෙම වෙනස්කම් පැහැදිලි කර ඇති අතර වෙනස් ආකාරයේ ඉච්ඡාභංගත්වය සහ මානසික ඍණාත්මකභාවය එහි ප්‍රතිඵලයක් විය හැකි බව පෙන්වයි (හෝරි 2010).

මානසික සුබ සාධනය පිළිබඳ ස්ත්‍රී පුරුෂ සමාජභාවිය වෙනස්කම් තිබේනම් එය අවබෝධ කරගැනීම වැදගත් වන්නේ පුද්ගලයන් බලසතු කිරීම තුළින් ස්වකීය හැකියාවන් තත්වාකාරයෙන් උපරිම කරගැනීම[8] (Self Actualization) සහ එම හැකියාවන්ගෙන් ප්‍රයෝජන ගැනීමට මෑත දී දරණ ලද උත්සහයන් නිසා වේ. (රෑත්මන් සහ අනිකුත් අය, 2003) ස්ත්‍රී පුරුෂ සමාජභාවිය වෙනස්කම් ඕනෑම සමාජයක සමාජ ක්‍රමය තුළ පවත්නා ස්ත්‍රීන් හා පුරුෂයන් සම්බන්ධ අසමානතා සහ ධූරාවලි පිළිබඳ පැහැදිලි කරයි. මෙවන් සමාජ ක්‍රම තුළ සම්පත් වෙන් කිරීම්, බලය හා අවස්ථා බෙදාදීම පිළිබඳව ස්ත්‍රීන් හා පුරුෂයන් හට වෙනස් ආකාරයෙන් සැලකේ (කුම්බා සහ අනිකුත් අය 2001, පිටු අංක 09). ස්ත්‍රී පුරුෂ සමාජභාවිය වෙනස්කම් කාලයත් සමග මෙන්ම සංස්කෘතීන් අතරද වෙනස් විය හැක. එම නිසා පුද්ගලයින් බලසතු කිරීම සහ සුභ සාධනය ළඟාකර ගැනීම උදෙසා වැඩසටහන් හා ප්‍රතිපත්ති සම්පාදනයේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවිය වෙනස්කම් අධයයනය කිරීම සහ අවබෝධ කර ගැනීම ඉතා වැදගත් වේ.

ශ්‍රී ලංකාවේ බදුල්ල දිස්ත්‍රික්කය තුළ මානසික සුභ සාධනය පිළිබඳ ස්ත්‍රීන් හා පුරුෂයන්ගේ අත් දැකීම් විමසා බැලීම උදෙසා දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA) ආයතනය මගින් සිදු කරන ලද බහුමාන දිළිඳුකම, අධ්‍යයනය පිළිබඳ මෙම පත්‍රිකාවෙන් අනාවරණය කරයි. මෙම සමීක්ෂණ ප්‍රශ්නාවලිය ඔක්ස්ෆර්ඩ් දිළිඳුකම සහ මානව සංවර්ධන උත්සාහයන් පිළිබඳ (OPHI)[9] ආයතනයේ, දිළිඳුකමේ අවධානයෙන් බැහැර වූ මානයන්, පිළිබඳ මොඩියුලයෙන් උපුටාගෙන සකස් කරන ලදී. සමන් (2007) දී ප්‍රකාශ කල පරිදි පුද්ගලයන්ගේ සතුට හා තෘප්තිමත්භාවය පිළිබඳ ස්ත්‍රී පුරුෂ සමාජභාවිය බලපෑම විමසා බැලීම සඳහා මනෝ විද්‍යාත්මක සුභ සාධනය සහ පුද්ගල නිශ්‍රිත සුභ සාධනය යන අංශ දෙක සලකා බලන ලදී.

මෙම පත්‍රිකාව පහත සඳහන් පරිදි සැලසුම් කර ඇත. දෙවන කොටස කාලයක් මුළුල්ලේ මානසික සුභ සාධනය මැනීම සම්බන්ධ මිනුම් දඬු වල පරිණාමය සහ විවේචන වෙත යොමු කළ විමසීමකි. තුන් වන කොටස තුළින් අධ්‍යයනයේ න්‍යායාත්මක රාමුව පිළිබඳ මෙන්ම මෙම විශ්ලේෂණය සඳහා දත්ත ලබා ගත් මූලාශ්‍ර, සමීක්ෂණ ප්‍රශ්නාවලිය සහ මිනුම් දඬු සඳහා භාවිතා කරන ලද ක්‍රමවේදය පිළිබඳ විමසීමක් සිදු කරයි. සිව්වන කොටසින් මනෝ විද්‍යාත්මක සහ පුද්ගල නිශ්‍රිත සුභ සාධනය පිළිබඳ ස්ත්‍රී පුරුෂ සමාජභාවිය විමසුමක් ඇතුළත් වේ. පස්වෙනි කොටසින් ලබාගත් නිගමන පිළිබඳ සාකච්ඡාවක් සිදු කරන අතර සයවන කොටසින් මෙම විශ්ලේෂණය පිළිබඳ සබඳතා සැලකිල්ලට භාජනය කර පත්‍රිකාවේ අවසන් නිගමනයන් ඉදිරිපත් කර ඇත.

---

[6] පුද්ගලයෙකු හැසිරිය යුතු ආකාරය, ඇඳුම් ඇඳිය යුතු පිළිවෙල කථාකළ යුතු පිළිවෙල ආදිය පිළිබඳ සමාජය තීරණය කිරීම ස්ත්‍රී පුරුෂ සමාජභාවිය කාර්යයභාරයන් අපේක්ෂාවන් ලෙස හඳුන්වයි. සම්ප්‍රදායික ස්ත්‍රී පුරුෂ සමාජභාවිය කාර්යයභාරයන් නම් පිරිමින් ආදායම් ඉපයීම සිදු කිරීම හා කාන්තාවන් දරුවන් රැක බලා ගැනීමේ කාර්යයෙහි නිරත වීමය.

[7] සමාජානුයෝජනය - සමාජය තුලින් සිදුවන ස්වකීය පිළිගැනිම සහ සමාජයේ අපේක්ෂාවන් උත්සහයෙන් ඉටු කිරීම නිසා තමා සමාජයේ වගකිවයුතු පුද්ගලයෙක් වීමේ ක්‍රියාවලිය සමාජානුයෝජනය වේ.

[8] ස්වකීය යථාර්ථවාදී බව පිළිබඳ වචනය ආබ්‍රහම් මාස්ලෝ විසින් විස්තර කර ඇත පරිදි, එය තම පුද්ගලික හැකියාව පිළිබඳ පූර්ණ සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය වේ.

[9] "දිළිඳු බවේ අවධානයෙන් බැහැර වූ මානයන්" පිළිබඳ වැඩි විස්තර සඳහා www.ophi.org.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

## 2. මානසික සුබ සාධනය සහ එහි මිනුම් දණ්ඩ



අතීතයේ මානසික සුබ සාධනය පිළිබඳ මූලිකව අවබෝධ කර ගැනීම සහ ඇගයීම පුද්ගල නිශ්‍රිත කරුණු මත පදනම්ව සිදුවිය. ග්‍රීක දර්ශනවාදියෙකු වූ ඇරිස්ටිපස් විසින් ඉදිරිපත් කළ සුඛපරමවාදය සහ ඉතාමත් ප්‍රායෝගික අනුගාමික දර්ශන වාදීන් විසින් විශ්වාස කරන ලද අදහසක් වූ ජීවිතයේ ඉලක්කය විය යුත්තේ වේදනාවෙන් තොර උපරිම සතුට අත් විදීම බව මානසික සුබ සාධනය පිළිබඳ ඉතාමත් පොදු නිර්වචනය වේ. මනෝවිද්‍යාව තුළ සුබ පරමවාදී සුබ සාධනය පහත සඳහන් පරිදි නිර්වචනය කර ඇත. එනම් මිනිස් සිතෙහි ඇති වන සතුට හා තෘප්තිමත්භාවය මෙන්ම සතුට උපරිම කිරීම සඳහා එහි යහපත් සහ අයහපත් අංග පිළිබඳ විමසා බැලීම වේ. (කහෙන්මාන් සහ අනිකුත් අය 1984 ගේ ප්‍රකාශනය හෝරි 2010 විසින් උපුටා දක්වා ඇති පරිදි) ඇමරිකානු මනෝවිද්‍යාඥයෙකු වූ මහාචාර්යය එඩ්වඩ් ඩයිනර් (1984) සතුට පිළිබඳ අදහස තව දුරටත් සංවර්ධනය කර පුද්ගල නිශ්‍රිත සුබ සාධනය පිළිබඳ සංකල්පය ඉදිරිපත් කරන ලදී (හෝරි 2010).

මානසික සුබ සාධනය පිළිබඳ පුද්ගල නිශ්‍රිත නිර්වචනය යටතේ අවධානය යොමු කරන කරුණු කිහිපයකි. එනම් පුද්ගල ප්‍රමුඛතා, රුචිකත්වය, මනෝමූලික කරුණු, වටිනාකම් සහ ආකල්ප වේ. (ස්කිමැක් 2009) එය ජීවිතයේ බාහිර සිද්ධීන් පිළිබඳ තෘප්තිමත්භාවයෙන් සමන්විත වන නමුත් කාර්යයන්, පවුල, මිතුරන්, අයහපත් බලපෑම් වලින් තොර සතුට භුක්ති විඳීම සහ පුද්ගලයින්ගේ සංවේදී ප්‍රතිචාර ඇගයීම්වලට අදාල වේ. (ජොශී 2010) පුද්ගල නිශ්‍රිත සුබ සාධනය වෙනස් වූ අංග දෙකකින් සමන්විත බව ප්‍රකාශ කර ඇත. එනම් අත්දැකීම්වල යහපත් හා අයහපත් බලපෑම් පිළිබඳ සුබ පරමවාදී ඇගයීම[10] සහ ප්‍රතිචාරකයින්ගේ ජීවන තෘප්තිය පිළිබඳ සංජානනීය ඇගයීම් වේ. එම නිසා පුද්ගල නිශ්‍රිත සුබ සාධනය යනු පුද්ගලයන්ගේ ජීවිත පිළිබඳ ඔවුන්ගේ සංවේදී මෙන්ම සංජානනීය අර්ථ නිරූපණය සහ ඇගයීම වේ (ඩයිනර්, 1984). පුද්ගල නිශ්‍රිත සුබ සාධනය සුබ පරම මිනුමක් ලෙස වෙන්කර දැක්වුවද මනෝ විද්‍යාත්මක යථාර්ථයන් මානව පැවැත්ම පිළිබඳ අවධානය යොමු කරන බැවින් ජීවිතයේ තෘප්තිමත්භාවය හුදෙක්ම සුබ පරමවාදී ද යන කරුණු පිළිබඳව තව දුරටත් විවාද පවතී. (පීටර්සන්, පාක් සහ සෙලිග්මාන් (2005)).

පුද්ගල නිශ්‍රිත සුබ සාධනය පිළිබඳ මිනුම් දඬු පොදුවේ භාවිත කල ද වසර ගණනක් මුළුල්ලේ එය විවාදයට බඳුන් වූවකි. මානසික සුබ සාධනයේ එක් අංශයක් පමණක් පුද්ගල නිශ්‍රිත සුබ සාධනය පිළිබඳ මිනුම් දඬු වලින් ආවරණය වන බව මෙම තර්කය වේ. එනම් මානසික සුබ සාධනයේ සත්‍ය අරුතෙහි ඇති දාර්ශනික සංකීර්ණ බව හසුකර ගැනීමට සුබ පරමවාදය අපොහොසත් වීම වේ. එමගින් ජීවිතයේ අර්ථය, අරමුණ, පුද්ගල අර්ථාන්විතභාවය යන සාධක මග හැරෙන අතර පුද්ගලයෙක් තම පැවැත්මෙහි අරුත පිළිබඳ අවබෝධයක් නැතිව සත්‍යවශයෙන්ම තෘප්තිමත්භාවයට පත්වන වාද යන කරුණු පිළිබඳව සාවද්‍යව සැලකීම වේ. පුද්ගල නිශ්‍රිත සුභ සාධනය සමග අන්තර් සබඳතාවයක් ඇති එහෙත් එයින් වෙනස් වූ පුද්ගල සංවර්ධනය සහ අර්ථය වැනි වෙනස් මානයන් ඇති බව බොහෝ මනෝවිද්‍යාත්මක අධ්‍යයනයන්ගෙන් පෙන්වා දී ඇත. (කොම්ප්ටන් සහ අනිකුත් අය, 1996).

---

[10] යහපත් සහ අයහපත්/ධනාත්මක සහ ඍනාත්මක බලපෑම් - සතුටුදායක සහ අසතුටුදායක හැඟීම් සහ කණස්සල්ල.

සුබ පරමවාදී සුබ සාධනය පිළිබඳ ප්‍රවේශය සඳහා වූ විවේචන වලට පිළිතුරක් ලෙස මෑතකදී eudaimonic ප්‍රවේශය ඉස්මතු විය. මෙම ප්‍රවේශය විශේෂයෙන්ම ග්‍රීක දර්ශනවාදීන් වූ සොක්‍රටීස් සහ ඇරිස්ටෝටල් යන චින්තකයින්ගේ නිර්මාණය විය. මෙම සංකල්පය තුළ eudaimonic ළඟා කරගැනීමට සුචරිතය/සද්ගුණය[11] අත්‍යවශ්‍ය බව තදබල ලෙස එකඟතාවයක් විය. එනම් මෙම සුභ සාධනයෙහි හුදු සතුටට වඩා වැඩි දෙයක් අඩංගු බවත් එය යමකුගේ සත්‍ය ස්වභාවය අවබෝධ කර ගැනීම ඇතුළත් බවත් පැවසේ. (වෝටර්මන්, 1993) සොක්‍රටීස්ගේ මතය පරිදි සුචරිතයෙන් තොරව පුද්ගලයෙකුට සතුටින් සිටිය නොහැකි මෙන්ම සුචරිතවාදී පුද්ගලයෙකුට අසතුටින් සිටීමටද නොහැකි වේ. තෘප්තිමත්භාවය මගින් eudaimonic ළඟා කරගත නොහැකි බවට ඇරිස්ටෝටල් විද්‍යාඥයා ද එකඟ වන නමුත් ජීවිතයේ සුචරිතවාදය පිළිබඳ එක් එක් මතවාද සුළු වශයෙන් වෙනස් වුවද සුචරිතවාදී අයෙක් තුලින් තෘප්තිමත්භාවය ළඟාකර ගත හැකි බවද ඔහු පවසයි. ක්‍රි. පූ. 350දී ඇරිස්ටෝටල් විසින් රචිත Nichomachean ආචාරධර්ම නමැති කෘතියේ සඳහන් පරිදි මානවයාගේ අවසන් ඉලක්කය විය යුත්තේ මානව හැකියාවන් අවබෝධ කරගැනීම වේ (රයෆ් සහ සින්ගර්, 2008). ස්වයං විනයෙහි වැදගත්කම අවධාරණය කරන ලද ස්ටොයික්ස් සහ විචක්ෂණශීලී හෙවත් සිහි බුද්ධියෙන් කටයුතු කිරීම තුලින්[12] සතුට ළඟා කරගත හැකි බව තර්ක කළ ජෝන් ලොක් යන ප්‍රවීන විද්වතුන් විසින් මෙම අදහස තව දුරටත් සංවර්ධනය කරන ලදී. තව දුරටත් නවීන eudaimonic දර්ශනවාදියෙකු වූ වෝටර්මන් මානව සුවතාවය, පුද්ගල වර්ධනය සහ සංවර්ධනය හා සබඳතාවක් ඇති බවට තර්ක කරයි. (වෝටර්මන් සහ අනිකුත් අය 2008).

මෑත අතීතයේදී මනෝවිද්‍යාව පිළිබඳ මහාචාර්යවරයෙකු වූ කැරල් රයෆ් (1995) විසින් eudaimonic හි අරමුණ සහිත ඉලක්කයක් වෙත යොමු වන ක්‍රියාකාරකම් අඩංගු වන බව නිගමනය කර ඇත. එමෙන්ම උසස්ම තත්ත්වය ළඟා කර ගැනීම සඳහා ඉතා වැදගත් අත්‍යවශ්‍යය අවසන් කරුණ අප සතුව පවතී. රයෆ් eudaimonic සම්බන්ධව මනෝ විද්‍යාත්මක සුබ සාධනය පිළිබඳ සංකල්ප මගින් ඉදිරිපත් කරයි. ඇය සතුට පිළිබඳ විවිධ ප්‍රවේශයන් විශ්ලේෂණය කර ඇති අතර අවසන් නිගමනය අනුව සුබ සාධනය අංග හයකින් සමන්විත යුතු බව පෙන්වා දී ඇත. එනම් තමා පිලිගැනිම (තමා සහ තම ජීවිතය පිළිබඳ ධනාත්මක ඇගයීම) පුද්ගල සංවර්ධනය, ජීවිතයේ අරමුණ, අනෙකුත් අය සමග සුහද සබඳතා, පරිසරය පිළිබඳ පරිපූර්ණ අවබෝධය සහ ස්වාධීනත්වය වේ (රයන් සහ ඩෙසී 2001). තව දුරටත් රයෆ් ඉදිරිපත් කරන ලද්දේ මෙම සය වැදෑරුම් අංග යහපත්/ධනාත්මක ලෙස මානසික හා කායික සුවය කෙරෙහි බලපාන බව මෙන්ම මෙම කරුණු පුද්ගල නිශ්‍රිත සුබ සාධනයේදී අත්‍යවශ්‍යයෙන්ම දායක නොවන බවය (හෝරි 2010). එම නිසා මෑත අතීතයේදී සමහර මනෝවිද්‍යාඥයින් විසින් මානසික සුබ සාධනය පිළිබඳ රාමුවක් ලෙස දර්ශනවාදී ප්‍රභේදයක් ඉදිරිපත් කරන ලදී. එනම් එය ජීවිතය යහපත් ලෙස ගත කරන අයගේ ජීවිත තුලින් සහ eudaimonic ප්‍රවේශය තුළින් මනෝවිද්‍යාත්මක සුබ සාධනය පිළිබඳ උත්පාදනය වූවක් මෙන්ම ජීවිතය සදාචාරාත්මක, සුචරිතවාදී වීම, ඊට හේතු සහ පුද්ගල සංවර්ධනයෙන් සමන්විත වූවකි. (රයෆ් සහ සින්ගර් 2008) පුද්ගල නිශ්‍රිත හා මනෝවිද්‍යාත්මක සුබ සාධනය පිළිබඳ දර්ශකයන් එකිනෙකට වෙනස්වුවද ඒවා එකිනෙක මත රඳා පවතින බව පෙනේ. මෙම ප්‍රවේශ දෙක එකිනෙකට වෙනස් වුවද, එකිනෙකට අනුපූරකයක් වන බව අධ්‍යයනයන්ගෙන් අනාවරණය වී ඇත.

[11] සුචරිතය - එනම් යහපත් ක්‍රියාවක් සිදු කිරීම වේ (රයන් සහ ඩෙසී, 2001).

[12] විචක්ෂණශීලී බව -විචක්ෂණශීලී බව පිළිබඳ කෙටිම නිර්වචනය වන්නේ රුජ්ජ් ර්ඵසද"ටසකඉසකකසමප වේ. එනම් යමක් කළ යුතු බව පිළිබඳ නිවැරදි හේතු වේ. විචක්ෂණශීලී බව ප්‍රඥාවන්ත දර්ශනවාදී න්‍යායික දැනීමක් නොව ප්‍රායෝගික දැනීමකි. විචක්ෂණශීලී බව අවධානය යොමු කරන්නේ විශ්වීය නොවෙනස් වන දෙයක් පිලිබඳ පමණක් නොව එදිනෙදා ජීවිතයේ දී සිදු වන අද්විතීය, අසහාය විචල්‍යයන් සම්බන්ධව වේ. ජීවිතයේ අරුත හා අරමුණ පිලිබඳව පුද්ගලයන් ඥානවන්ත විය හැක. එහෙත් ඔහුගේ අත්දැකීම් අඩු කම නිසා ඔහු මුහුණ දෙන ජීවිතයේ යම් අවස්ථාවලදී හොඳ තීරණ ගැනීමට නොහැකි විය හැක. ඔහු විශ්විය මූල ධර්ම එදිනෙදා ජීවිත අවස්ථාවලදී භාවිතා කරන අන්දම දැන සිටිය යුතු වේ. යම් පුද්ගලයෙක් විචත්ෂණශීලි නම් ඔහු හොඳ තීරණ ගන්නා අන්දම පිළිබඳව අනෙක් අයට ඉගැන්විය හැක.

## 3. අධ්‍යයනයේ න්‍යායික රාමුව සහ ක්‍රමවේදය පිළිබඳ විමසුමක්



බහුමාන දිළිඳුකම[13] පිළිබඳ සංසිද්ධිය තුළ මානසික සුභ සාධනයේ ඌණතාවයන් ද හඳුනාගෙන ඇත. කාලයක් මුළුල්ලේ දිළිඳුකම පිළිබඳ ආර්ථික දර්ශකයන්ගේ සිට සමාජ දර්ශක දක්වාද ඉන් අනතුරුව මනෝවිද්‍යාත්මක දර්ශක දක්වාද විකාශනය වු සුබ සාධනය පිළිබඳ අදාල මානයන් රාශියක් බහුමාන දිළිඳුකම පිළිබඳ විශ්ලේෂණයේ දී හඳුනාගෙන ඇත. කෙසේ වුවද පුද්ගල/කුටුම්භ මට්ටමෙහි දිළිඳුකමෙහි සංකීර්ණභාවය අවබෝධ කර ගැනීම පිණිස ජාත්‍යන්තර මට්ටමේ සංසන්දනාත්මක දත්තවල ඌණතාවයන් තවමත් පවතී. මෙම ඌණතාවය සම්පූර්ණ කිරීම සඳහා ඔක්ස්ෆර්ඩ් සරසවියේ දිළිඳුකම සහ මානව සංවර්ධන උත්සාහයන් (OPHI) විසින් ප්‍රධාන කරුණු පහක් මැනීම සඳහා අදාල පහසු දර්ශක හා මිනුම් දඬු හඳුනාගෙන ඇත. මෙම මානයන් පහට මානසික සුභ සාධනය ද ඇතුළත් වන අතර ඒවා ජාතික මට්ටමේ සමීක්ෂණ සහ මානව සංවර්ධන අධ්‍යයනය තුලින් විශාල ලෙස මගහැරී ඇත. මෙම පස් වැදෑරුම් දිළිඳුකමේ අවධානයෙන් බැහැර වූ මානයන් වන්නේ රැකියාවේ ගුණාත්මකභාවය, බලසතුකරණය, ශාරීරික ආරක්ෂාව, ලැජ්ජාව, අවමානය සහ මනෝවිද්‍යාත්මක හා පුද්ගල නිශ්‍රිත සුභ සාධනය වේ. ඔක්ස්ෆර්ඩ් සරසවියේ දිළිඳුකම හා මානව සංවර්ධන උත්සහයන් විසින් ජාතික මට්ටමේ කුටුම්භ සමීක්ෂණ වලදී ඇතුළත් කළ හැකි ප්‍රශ්නාවලි මොඩියුලයන් සම්පාදනය කරන ලදී. මෙම ප්‍රශ්නාවලිය 2009/2010 වසර වල නයිජීරියාව, චැඩ් රාජ්‍යය සහ ශ්‍රී ලංකාව යන රටවල් තුනෙහි නියමු අධ්‍යයනයක් ලෙස සිදු කරන ලදී.

මෙම නියමු සමීක්ෂණය ශ්‍රී ලංකාවේ බදුල්ල දිස්ත්‍රික්කය තුළ නාගරික, ග්‍රාමීය සහ වතු, යන අංශ තුනම ආවරණය වන පරිදි සිදු කරන ලදී. බදුල්ල ශ්‍රී ලංකාවේ දිළිඳුම දිස්ත්‍රික්කයක් වන අතර පරිභෝජන දිළිඳුභාවයෙහි මට්ටම් වෙනස්වන අතර එය 12,9% සිට 51.15% අතර පරාසයක ව්‍යාප්ත වී ඇත. එම තොරතුරු පළාතෙහි දිළිඳුකමේ විවිධ වූ ව්‍යාප්තිය පිළිබඳ කරුණු ගෙනහැර දක්වයි.

මෙම අධ්‍යයනය සඳහා මූලික වශයෙන් දත්ත එක් රැස් කරනු ලැබුවේ කුටුම්භ සමීක්ෂණයක් තුළිනි. ශ්‍රී ලාංකික සන්දර්භය තුළ භාවිතා කළ මානයන් සහ දර්ශකවල අදාළභාවය විමසා බැලීමට තවදුරටත් ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා සහ තෝරාගත් ප්‍රධාන තොරතුරු සපයන්නන් සමග සාකච්ඡා මෙහෙයවනු ලැබිනි. මෙම අධ්‍යයනයේදී මිශ්‍ර ක්‍රමවේදය භාවිතා කළ අතර සංඛ්‍යාත්මක මෙන්ම ගුණාත්මක දත්තද එක්රැස් කර විශ්ලේෂණය කරන ලදී. කුටුම්භ සමීක්ෂණය සිදු කරනු ලැබුවේ OPHI හි අවධානයෙන් බැහැර වූ මානයන් පිලිබඳ මොඩියුලය ශ්‍රී ලාංකික සන්දර්භයට අදාල ලෙස සකස් කර ගැනීමෙනි[14]. සසම්භාවි ස්ථර නියදි ක්‍රමවේදය භාවිතා කර කුටුම්භ 260 ක් නියදියට ඇතුළත් කර ගන්නා ලදී. මෙම ස්ථර නියැදි ක්‍රමය සිදු කරනු ලැබුවේ බදුල්ල දිස්ත්‍රික්කය තුල පරිපාලන ප්‍රදේශ තෝරා ගැනීම සඳහාය. සම්මුඛ සාකච්ඡා සඳහා කුටුම්භ සම්මුඛ සාකච්ඡා සඳහා කුටුම්භ තෝරාගනු ලැබුවේ ක්‍රමාණුකූල නියැදි සමීක්ෂන ක්‍රමවේදය මගිනි. දකුණු අත් න්‍යාය භාවිතා කර සෑම නිවෙස් පහකටම එකක් සම්මුඛ සාකච්ඡාව සඳහා තෝරා ගන්නා ලදී. මෙම සමික්ෂණයේදී දිස්ත්‍රික්ක සහ ආංශික මට්ටම් නියෝජනය විය.[15]

---

13 සුභ සාධනය පිළිබඳ ඌණතාවය දිළිඳුකම බව පොදු සම්මුතිය වේ (ගුණවර්ධන 2004, 10).

14 කුටුම්භ සමීක්ෂණ ප්‍රශ්නාවලියේ පිටපතක් http///www.ophi.org.uk/research/missing dimensions/projects වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

15 නාගරික කුටුම්භ සංඛ්‍යාව 30කට වඩා වැඩි කිරීම සඳහා නියැදියට බර තබන ලදී.

කුටුම්භ සමීක්ෂණයේදී තොරතුරු සැපයීම ගෘහ මූලිකයා හෝ ඔහුගේ සහකරු/සහකාරිය විසින් සිදු කර ඇත. ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම තොරතුරු දායකයින් ලබා ගැනීමට උත්සහ දරන ලද අතර අවසානයේදී සම්මුඛ සාකච්ඡා 229ක් සම්පූර්ණ කරන ලදී.

**වගු අංක 01- නියැදියෙහි පැතිකඩ**

| ආංශික වශයෙන් නියැදියේ ව්‍යාප්තිය | පිරිමි | ගැහැණු | නියැදියේ සම්පූර්ණ සංඛ්‍යාව* | බදුල්ල දිස්ත්‍රික්කයේ සම්පූර්ණ සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| වතු අංශය | 25% | 16% | 20% | 20% |
| ග්‍රාමීය අංශය | 70% | 75% | 73% | 73% |
| නාගරික අංශය | 5% | 8% | 7% | 7% |
| නියැදියේ ස්ත්‍රී පුරුෂ බෙදීම | 45% | 55% | අදාල නැත | අදාල නැත |
| රැකියා විරහිත තොරතුරු දායකයින් | 20% | 73% | 49% | අදාල නැත |
| දිළිඳුකමේ ආදායම් මට්ටමට වඩා ඒක පුද්ගල ආදායම අඩු තොරතුරු දායකයින්*** | 52% | 51% | 52%[16] | 24%[17] |
| ද්විතියිය අධ්‍යාපනයට වඩා පහළ මට්ටමේ සිටි තොරතුරු දායකයින් | 30% | 34% | 32% | අදාල නැත |

* දිස්ත්‍රික් මට්ටමේ නියෝජනය ලබා ගැනීමට බර තබන ලදී. මූලාශ්‍රය කුටුම්භ සමීක්ෂණයෙහි ප්‍රතිඵල, සේපා, 2010.

** මූලාශ්‍රය DCS 2007, සහ DCB 2009

*** 2010 ජනවාරි මසට දිස්ත්‍රික්කයේ දිළිඳුකමේ මට්ටම සමීක්ෂණ දත්ත එක් රැස් කිරීමේ කාලයට සමපාත වීම සඳහා - රු.3079 ක් ලෙස සලකන ලදී.

මානසික සුබ සාධනය පිළිබඳ වෙනස් මාතෘකා දෙකක් යටතේ විශ්ලේෂණය කිරීම සඳහා මෙම නියැදි සමීක්ෂණයේදී රැස් කර ගන්නා ලද දත්ත භාවිතා කරන ලදි. එනම් අදාළ සාහිත්‍යයේ ඉදිරිපත් කර ඇති පරිදි මනෝවිද්‍යාත්මක හා පුද්ගල නිශ්‍රිත සුබ සාධනය පිළිබඳ විශ්ලේෂණය කිරීම සඳහා වේ.

OPHI අධ්‍යයන පත්‍රිකාව[18] පදනම් කරගෙන මානයන් සඳහා දර්ශක සකස් කරගත් අතර මූලික විශ්ලේෂණයේදී විශ්ලේෂණ ඒකකය වූයේ පුද්ගලයන් හෙවත් තොරතුරු දායකයන් වේ.

මෙම විශ්ලේෂණයෙහි අරමුණු පහත සඳහන් පරිදි වේ.

1) මෙම මොඩියුලයෙහි ඉදිරිපත් කර ඇති ප්‍රශ්න පිළිබඳ බාහිර හා අභ්‍යන්තර වලංගුභාවය පිළිබඳ ගෙනහැර දැක්වීම. ගුණාත්මක තොරතුරුවලින් සොයාබැලීමට අපේක්ෂා කරන ලද සංකල්පමය ප්‍රශ්න පිළිබඳ වලංගුභාවය බාහිර වලංගුභාවය තුළින්ද දර්ශක අතර සබඳතාවය අවබෝධ කරගැනීම සඳහා සංඛ්‍යාත්මක විශ්ලේෂණය මගින් අභ්‍යාන්තර වලංගුභාවය ද සලකා බැලීම.

2) නියැදිය තුළ මනෝවිද්‍යාත්මක සහ පුද්ගල නිශ්‍රිත සුබ සාධනයෙහි මට්ටම් සහ ව්‍යාප්තිය පිළිබඳ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය දෘෂ්ඨිකෝණයෙන් විස්තර කිරීම.

3) ස්ත්‍රී පුරුෂ සමාජභාවය, මනෝවිද්‍යාත්මක සහ පුද්ගල නිශ්‍රිත දර්ශක අතර ඇති සබඳතාවය විශ්ලේෂණය කර සංයුක්ත මිනුම් දණ්ඩක් උත්පාදනය කිරීම.

මෙම විශ්ලේෂණය පියවර කිහිපයකින් සිදු කෙරිනි.[19] ප්‍රථමයෙන් ජාතිය, ආගම, ක්ෂේත්‍ර, අධ්‍යාපනය, ආදායම, රැකියාව වැනි විවිධ උප කණ්ඩායම් තුළ ස්ත්‍රී පුරුෂභාවය අනුව දර්ශකවල විසිරීම පිළිබඳ අවබෝධ කර

---

[16] ඒක පුද්ගල ආදායම ශ්‍රී ලංකාවේ බදුල්ල දිස්ත්‍රික්කයෙහි දිළිඳුකම පිළිබඳ අත්හැරුනු මානයන් පදනම් කරගෙන විශ්ලේෂණය කරන ලදී.

[17] ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙන් 2006/2007 වර්ෂයේදී සිදුකල කුටුම්භ ආදායම් හා වියදම් සමීක්ෂණය අනුව ඒක පුද්ගල පරිභෝජනය පදනම් කරගෙන සකසා ඇත.

[18] යෝජිත දර්ශක පිළිබඳ වැඩිදුර සාකච්ඡාව සඳහා සමන්(2007) බලන්න.

[19] මනෝ විද්‍යාත්මක සුභ සාධනය මැනීම පිණිස දර්ශක/විචල්‍යයන්/මානයන් සැකසීමට විචල්‍යයන් සංයුක්ත කිරීම සඳහා අනුගමනය කළ ක්‍රියා පිළිවෙල ඇමුණුම් 1හි බලන්න.

පුද්ගල නිශ්‍රිත සුභ සාධනය මැනීම පිණිස දර්ශක/විචල්‍යයන්/මානයන් සැකසීමට විචල්‍යයන් සංයුක්ත කිරීම සඳහා අනුගමනය කල ක්‍රියා පිළිවෙල සඳහා ඇමුණුම් 2 බලන්න.

ගැනීම සඳහා සියලුම විචල්‍යයන් පිලිබඳ විස්තරාත්මක විශ්ලේෂණයක් සිදු කරන ලදී. සෑම ප්‍රශ්නයකටම ලැබුනු ප්‍රතිචාරවල සංඛ්‍යාතය භාවිතා කර යොදාගත් දර්ශකයන් තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවිය වෙනස්කම් විශ්ලේෂණය කිරීම සඳහා යෝග්‍යදැයි විමසා බලන ලදී. බහුවරණ ප්‍රශ්න සඳහා සාධක විශ්ලේෂණය (Factor analysis) භාවිතා කර ප්‍රතිචාර ව්‍යුහයෙන් අපේක්ෂා කරන ලද සාධක එලෙසින්ම පවතීදැයි තහවුරු කර ගන්නා ලදී. මෙම අධ්‍යනයේදී භාවිතා කරන ලද දර්ශකවල ඌණතාවයන් අවබෝධ කරගැනිම සඳහා සංයුක්ත දර්ශක/සූචියක් සකස් කිරීමට මෙම ප්‍රතිඵල භාවිතා කරන ලදී. ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා අනෙකුත් විචල්‍යයන්, දර්ශක හා මානයන් පිලිබඳ සබඳතා සහ මෙවැනි හෝ මේ හා සමාන එකිනෙකට බැඳුනු සංකල්ප පිලිබඳ සබඳතා තහවුරු කර ගැනීමට සසම්භාවී විශ්ලේෂණය (Correlation Analysis) භාවිතා කරන ලදී.

සංයුක්ත දර්ශක/සූචිය මට්ටම් දෙකකින් සංවර්ධනය කරන ලදී. පළමුව සාධක විශ්ලේෂණය (Factor Analysis) භාවිතා කර මනෝවිද්‍යාත්මක/පුද්ගල නිශ්‍රිත සුබ සාධනය මැනීම සඳහා සංවර්ධනය කරන ලදී. එය සංවර්ධනය කරනු ලැබුවේ විවිධ දර්ශක මගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවිය දිළිඳුකම මැන බැලීම සඳහා වේ. මේ සඳහා දර්ශකයන් තුළ තිබුන විචල්‍යයන් සඳහා සමාන බර තැබීමක් සිදු කරන ලදී.[20] දෙවන සංයුක්ත දර්ශකය සංවර්ධනය කරනු ලැබුවේ මනෝවිද්‍යාත්මක/පුද්ගල නිශ්‍රිත සුබ සාධන මානයන් පිලිබඳ ස්ත්‍රී පුරුෂ භාවය අනුව ඌණතාවයන් මැන බැලීම සඳහා වේ. නැවත මානයන් තුල ඇති දර්ශක වලට සමාන ලෙස බර තබන ලදී. එක්සත් ප්‍රවේශය[21] (Union Approach) භාවිතා කර විචල්‍යයන් දර්ශක හා මානයන් හි ඇති ඌණතාවයන් පරීක්ෂා කර බලන ලදී. ඕනෑම දර්ශකයක ඌණතාවයක් දිළිඳුකමේ ගැඹුර පිලිබඳ අවබෝධ කර ගැනීම පිණිස මානයන් හි ඌණතාවයක් ලෙස සලකා බලන ලදී.

අවසන් වශයෙන් දර්ශකයන්ගේ ඌණතාවයන් එනම් සතුට, තෘප්තිමත්භාවය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය වැනි මානයන් තුළ ඇති වෙනත් දර්ශකයන් වෙනස් කිරීමට හෝ බලපෑමක් සිදු කිරීමට කොතරම් දුරට දායක වුවද යන්න තහවුරු කර ගැනිම පිණිස (Logistic Regression Analysis) භාවිතා කරන ලදී.

---

[20] බර තැබීමේ ක්‍රමය නම් දර්ශකයන් ඇතුළත ඇති සියළුම විචල්‍යයන් සඳහා සමාන ලෙස බර තැබීම හෝ වැදගත්කමක් දීම වේ. මේ නිසා තොරතුරු දායකයින් විසින් පිළිතුරු දෙන ලද සියළුම විචල්‍යයන් සමාන ලෙස වැදගත් බව සලකා බලනු ලැබේ.

[21] අල්කයර්, එස් සහ ෆොස්ටර් ජේ. (2008). දිළිඳුකම පිලිබඳ බහුවිධ මානයන් ගණනය කිරීම ඔෂ්‍යෂ අධ්‍යයන පත්‍රිකා 07, ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලය.

## 4. ප්‍රතිඵල



මෙම පරිච්ඡේදයෙන් සමන් (2007) විසින් මනෝවිද්‍යාත්මක සහ පුද්ගල නිශ්‍රිත සුබ සාධනය පිළිබඳ ඉදිරිපත් කරන ලද මිනුම් දඬු අනුව මානසික සුබ සාධනය පිලිබඳ ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේ අත්දැකීම් පිළිබඳ අවධානය යොමු කරයි.

### 4.1 පුද්ගල නිශ්‍රිත සුබ සාධනය : සතුට හා ජීවිතයේ තෘප්තිමත්භාවය

පුද්ගල නිශ්‍රිත සුබ සාධනය දර්ශක දෙකක් පදනම් කරගෙන විශ්ලේෂණය කරන ලදී. එනම් ජීවිතයේ තෘප්තිමත්භාවය හා සතුට වේ. ඍණාත්මක බලපෑම් අභිබවා සිදුවන ප්‍රබලම ධනාත්මක බලපෑම්[22] ජීවිතයේ තෘප්තිමත්භාවය ලෙස (බ්‍රැඩ්බර්න්, 1969) විසින් විස්තර කර ඇත. එමෙන්ම (සමන් 2007) කෙටි කාලීන සිදුවීම්වලදී පහසුවෙන් ප්‍රතිචාර දැක්වීම ජීවිතයේ තෘප්තිමත්භාවය ලෙස විස්තර කර ඇත. බදුල්ල දිස්ත්‍රික්කයේ සිදු කළ සමීක්ෂණ දත්ත තුලින් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේම තෘප්තිමත්භාවය ඉහල මට්ටමක පවතින බව අනාවරණය විය. සමීක්ෂණයට භාජනය වූ තොරතුරු දායකයින්ගෙන් 90% ක්ම ඉතාමත් සතුටින් හෝ සාමාන්‍ය ලෙස සතුටින් දිවි ගෙවන බව හෙලි විය. කෙසේ වුවද සංඛ්‍යානමය තොරතුරු අනුව එය පැහැදිලිව විද්‍යාමාන නොවේ. එනම් ජීවිතයේ ඉතා සතුටින් දිවි නොගෙවන බව හෝ කිසිසේත්ම සතුටින් දිවි නොගෙවන බව ප්‍රකාශ කල තොරතුරු දායකයින් අතරින් ස්ත්‍රී පක්ෂයේ ප්‍රතිශතය (12.4%) පුරුෂ පක්ෂයේ ප්‍රතිශතයට (7%) වඩා සාපේක්ෂව වැඩි වේ.[23] සමීක්ෂණ දත්ත වලින් අනාවරණය වන කරුණක් නම් ජීවිතයේ අසතුට ආදායම, රැකියාවේ තත්ත්වය, හා දරුවන් වැනි සමාජ/ආර්ථික සාධක මත සබඳතාවක් පවත්වන බවය. තමාටත් රැකියාවක් කිරීමේ අවස්ථාවක් උදා වුවහොත් තම පවුලේ ආදායමටද දායකත්වයක් ලබා දී තම පවුලේ ආදායම වැඩිකර ගැනීමට දායක විය හැකි බවත් තම ජීවන තත්ත්වය නගා සිටුවිය හැකි බවත් කාන්තාවන්ගේ අදහස විය. ඊට අමතරව, රැකියාවල නියුතු කාන්තාවන් උසස් අධ්‍යාපනයක් ලැබූ දරුවන් සමග යහපත් සමාජ ආර්ථික තත්ත්වයක පසුවන අතර ජීවිත කාලය තුල එම වෙනස්වීම් සමග සතුටින් පසු වේ.

> ''මම සිටින්නේ සතුටින් මගේ දරුවන් මේ මට්ටමට ගෙන ඒමට මම බොහෝ දුක් වින්දා. ඔවුන්ට තවමත් ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු අවසන් කිරීමට තියෙනවා. ඔවුන් හොඳට ඉගෙන ගත්තොත් මම සතුටු වෙනවා. අපිට අපේ ගේ හදාගෙන ඉවර කර ගන්නත් තියෙනවා. මම මගේ කොටස කාර්යය ඉටුකළා. ඒ නිසා මම සතුටු වෙනවා''
>
> (අවුරුදු 40ක කාන්තාවක්)

එයට අමතරව පහත් සමාජ ආර්ථික මට්ටම්වල පසුවන දිළිඳු ප්‍රජාව සමාජ සංසන්දන ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස අයහපත්/ඍණාත්මක බලපෑම් වලට ගොදුරුවන බව විද්‍යාමාන වේ. එනම් ස්ත්‍රී පුරුෂභාවය සැලකිල්ලට නොගෙන අනිකුත් අය සමග සැසඳීමේදි දිළිඳු පුද්ගලයන්ට අසාධාරණ ලෙස සම්පත් ලබා ගැනීමේ නොහැකියාව පවතින බව හැඟී ඇති අතර එම අසමානතා යෝග්‍ය ලෙස සකස් කිරීමටද හැකි වේ.

[22] යහපත් සහ අයහපත් බලපෑම් සතුටුදායක අසතුටුදායක හැඟීම් හා කණස්සල්ල.

[23] දර්ශක, විචල්‍යය ඇසුරින් පුද්ගල නිශ්චිත සුභ සාධනය පිළිබඳ ඌණතාවය, ඇමුණුම් 04 බලන්න.

"කුඹුරු වැඩ කරද්දි සමහර වෙලාවට හිතෙනවා ඇයි අපි දුප්පත් වෙලා ඉපදුනේ කියලා. ගමේ සමහර අයගේ මට්ටමට වඩා අපි පහලින් ඉන්නකොට අපි නිතරම එයාලගේ උසුළු විසුළු වලට ලක් වෙනවා. අපි වගේම දුප්පත් අය අතරේ අපිට අසාධාරණයක් වෙන්නේ නැහැ. අපිට වඩා ලොකු මට්ටමේ අය අතරේ ඉන්නකොට තමයි අපිට අසාධාරණ විධියට සලකන්නේ."

(අවුරුදු 42 පිරිමි කෙනෙක්)

ජීවිතයේ තෘප්තිමත්භාවය පුද්ගල නිශ්‍රිත සුබ සාධනයෙහි දෙවන දර්ශකය[24] වේ. මෙම දර්ශකය තුලින් විචල්‍යයන් දෙකක් සලකා බැලෙන අතර ඒවා නම් ජීවිත තෘප්තිමත්භාවය සහ එක් එක් අංශ/ක්ෂේත්‍ර වලට සුවිශේෂී වූ ජීවිත තෘප්තිමත්භාවය[25] වේ. මෙය ජීවිත තෘප්තිමත්භාවයට පොදුවේ අදාල බව කුමින්ස් (1969) තර්ක කරයි. කුමින්ස්ට අනුව පූර්ණ තෘප්තිමත්භාවයේ දී එක් එක් අංශ/ක්ෂේත්‍ර අතර පැහැදිලි වෙනස්කමක් දක්නට ලැබේ. එහෙත් මෙම පැහැදිලි වෙනස්කම් තුලින් එය ජීවිතයේ පූර්ණ තෘප්තිමත්භාවයට කොතරම් වැදගත්ද/අදාලද යන බව පිළිබඳ පුද්ගලයන් සිතන ආකාරය පෙන්නුම් නොකරයි. පුද්ගලයන්ගේ තෘප්තිමතභාවයේ මට්ටම පදනම්ව ලබා ගන්නා විනිශ්චයන් මෙම අංශ/ක්ෂේත්‍රවල වැදගත්කම/අදාලතාවය පිළිබඳ නොසලකා ඇති බව තව දුරටත් ඔහු තර්ක කරයි. නිදසුනක් ලෙස එක සමාන තෘප්තිමත්භාවයන් වලදී පුද්ගලයන් එක් අංශය/ක්ෂේත්‍රයකට වඩා තවත් අංශයක්/ක්ෂේත්‍රයක්ම වැදගත් බව සැලකිය හැක. මෙම විශ්ලේෂණයේදී සෑම ක්ෂේත්‍රයක්ම සමාන ලෙස වැදගත් බව උපකල්පනය කර සෑම ක්ෂේත්‍රයකටම සමාන ලෙස බර තබන ලදී.

සමීක්ෂණ ප්‍රතිඵල අනුව ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම ඉහළ මට්ටමේ තෘප්තිමත් භාවයකින් පසුවන බව පෙන්නුම් කරයි. තොරතුරු දායකයින්ගෙන් 90% ආහාර, ආරක්ෂාව, පවුල, තත්වය, අනෙකුත් අයට උදව් කිරීමේ හැකියාව, ආගම, යන අංශ/ක්ෂේත්‍ර පිළිබඳව තෘප්තිමත් භාවයන්ගෙන් පසුවන බව හෙළි වේ. එහෙත් සිත්ගන්නා සුළු අයුරින් පිරිමින් හා සැසඳීමේදී කාන්තාවන් තමාට ස්වාධීනව තෝරාගැනීමේ ඇති නොහැකියාව පිළිබඳ තෘප්තිමත් නොවේ.

කාන්තාවන්ගේ ස්වාධීන තෝරාගැනීමේ හැකියාව හා ආදායම රැකියාව/කාර්යය සහ අධ්‍යාපනය වැනි ජීවිතයේ වෙනත් අංශ/ක්ෂේත්‍ර සමග ඇති සබඳතාවය ගුණාත්මක දත්ත වලින් හෙළි වේ. එමෙන්ම ආර්ථික ස්වාධිනත්වය නොමැතිකම, අඩු අධ්‍යාපනය සහ විරැකියාව කාන්තාවන්ගේ ස්වාධීන තෝරාගැනීම් සඳහා අධෛර්යට පත් කරන හේතු බව ගුණාත්මත දත්ත වලින් පිළිබිඹු වේ. කෙසේ වුවද නිවස තුල සාම්ප්‍රදායික පුරුෂාධිපත්‍යයට කාන්තාවන් මනාපයක් දක්වන බව තවත් සිත් ගන්නා සුළු කරුණකි. බොහෝ අවස්ථාවල තම දෛනික කටයුතු සඳහා තීරණ ගැනීමට ස්වාමිපුරුෂයාට අවස්ථාව දෙන බවත් ඔවුන්ට ගරු කිරීමක් ලෙස එම තීරණ වලට කාන්තාවන් සහයෝගය දක්වන බවත් කාන්තාවන් විසින් ඉදිරිපත් කරන ගුණාත්මක තොරතුරු වලින් හෙළිදරව් විය.

"මහත්මයා තමයි ගොඩක් දේවල් තීරණය කරන්නේ. ඒක මට සතුටක්"

(අවුරුදු 42ක කාන්තාවක්)

ජීවිතයේ විවිධ අංශ/ක්ෂේත්‍ර පිළිබඳ තෘප්තිමත්භාවය සම්බන්ධයෙන් පැහැදිලි සොයා ගැනීම් දෙකක් අධ්‍යයනයෙන් හෙළිදරව් විය. කාන්තාවන් හා සැසඳීමේදී පිරිමින් මිතුරු මිතුරියන් සිටීම සම්බන්ධව අඩු තෘප්තිමත්භාවක් දක්වන බව අනාවරණය වූ එක් කරුණකි. මයර්ස් (1992) දී පැහැදිලි කර ඇති පරිදි වැඩිහිටියන් වශයෙන් පිරිමින්ගේ සමාජ විරෝධී ස්වභාවය පැහැදිලි වන අතර පිරිමින් තමා සමග සම්බන්ධකම් පවත්වන පුද්ගලයන් සමග එක්ව කටයුතු කිරිමට එතරම් මනාපයක් නොදක්වන බව මනෝ විද්‍යාත්මක සුභ සාධනය පිළිබඳ කොටසේදී අනාවරණය විය. අධ්‍යයනයෙන් අනාවරණය වූ දෙවන කරුණ වූයේ කාන්තාවන් තම සෞඛ්‍යය පිළිබඳ එතරම් තෘප්තිමත් භාවයක නොසිටින බවය. මෙම සෞඛ්‍ය ගැටළු බොහෝ විට සෘජුවම ඔවුන්ට බලපාන කරුණක් වන අතර තම පවුලේ අනෙකුත් අයගේ සෞඛ්‍ය තත්වය පිළිබඳව ඔවුන් කණගාටු වේ. මෙය ඔවුන්ගේ ජීවිතවල තෘප්තිමත්භාවයට බලපායි. මෙය තවදුරටත් කාන්තාවන්ගේ සාම්ප්‍රදායික පවුල රැකබලාගැනීමේ කාර්යය පිළිබිඹු කරයි.

---

[24] පුද්ගල නිශ්‍රිත සුබ සාධනය පිළිබඳ විචල්‍යයන්, දර්ශකයන්/විචල්‍යයන්/මානයන් සැකසීම සංයුක්ත ලෙස සැකසීම පිණිස අනුගමනය කළ ක්‍රියාමාර්ග සඳහා ඇමුණුම් 02 බලන්න.

[25] ජීවිත තෘප්තිමත්භාවය පිළිබඳ කුමින් ඉදිරිපත් කළ අංග 07 සඳහා ඇමුණුම් 05 බලන්න.

"මගේ ස්වාමි පුරුෂයා හෘදය රෝගියෙක්. කලින් ඔහු දෛනික වැටුපට වැඩ කළ කම්කරුවෙක්. නමුත් පසුගිය මාස 07,08 කාලය තුල ඔහුගේ පපුවේ වේදනාව නිසා ඔහුට වැඩ කළ නොහැකිය. ඔහු මේ සඳහා බෙහෙත් ගත්තේ නැත්තම් ඔහුගේ පපුවේ වේදනාව එනවා. ඔහුට නොකඩවාම දියතලාව රෝහලෙන් බෙහෙත් ගන්නට සිදු වෙනවා. අපි දෙදෙනාම දූන් හම්බ කරන්නේ නැහැ. දරුවන්ගේ මුදල් වලින් තමයි ජීවත් වීමට සිදු වෙලා තියෙන්නේ."

(අවුරුදු 52ක කාන්තාවක්)

සමස්තයක් ලෙස ජීවිතයේ පූර්ණ තෘප්තිමත්භාවය සහ අංශ/ක්‍ෂෙත්‍ර මූලික ජීවිත තෘප්තිමත්භාවය ලෙස ඒකරාශී කරන ලදී. නියැදිය තුළ ජීවිත තෘප්තිමත්භාවය පිළිබඳ සංයුතියෙහි ස්ත්‍රී පුරුෂභාවයේ වෙනසක් දක්නට නොලැබෙන බවද නමුත් සතුට සම්බන්ධව පැහැදිලි ධනාත්මක සබඳතාවක් පෙන්නුම් කරන බවද හෙලි විය. ජීවිතයේ තෘප්තිමත්භාවය ඌණ පිරිස අතරින් ජීවිතයේ සතුට අහිමි පිරිස සිව් ගුණයකට වඩා වැඩිවේ.[26] කෙසේ වුවද සතුට හා ජීවන තෘප්තිමත්භාවය පිළිබඳ සංයුක්ත මිනුම් දණ්ඩක් ලෙස පුද්ගල නිශ්‍රිත සුබ සාධනය විශ්ලේෂණය කරන ලද අතර පිරිමින් හා ගැහැණුන් පුද්ගල නිශ්‍රිත සුබ සාධනය අත් විඳින ආකාරයේ පැහැදිලි වෙනසක් නොමැති බව අනාවරණය විය.[27]

## 4.2 මානසික සුබ සාධනයः ජීවිතයේ අරුත සහ ආත්මාභිමානය

මෙම අධ්‍යයනයේදී මානසික සුභ සාධනය මැනීම පිණිස eudaimonic ප්‍රවේශ දෙකක් පදනම් කර ගන්නා ලදී. එනම් ජීවිතයේ අරුත[28] සහ ආත්මාභිමානය පිළිබඳ න්‍යාය වේ.[29] පුද්ගලයෙකුගේ මානසික සුබ සාධනය කෙරෙහි ජීවිතයේ අරුත සහ ප්‍රශස්ත ලෙස ක්‍රියාකාරීත්වයට අදාල මූලික නිර්නායකයන්[30] තුන කොතරම් දුරට දායකවන්නේ ද යන්න පිළිබඳ අධ්‍යයනයෙන් අනාවරණය කෙරේ.

බදුල්ල ප්‍රදේශයේ සිදුකල අධ්‍යයනයෙන් ජීවිතයේ අරුත පිළිබඳ පිරිමින් හා කාන්තාවන්ගේ අත්දැකීම් අතර පැහැදිලි වෙනසක් දක්නට ලැබේ.[31] තොරතුරු දායකයින්ගෙන් බහුතරයකට එනම් (75%) ජීවිතයේ අරුත පිළිබඳ අවබෝධයක් ඇත. මානසික සුභ සාධනය පිළිබඳ ඌණතාවයක් ඇති පුද්ගලයන්ගෙන් (ජනගහණයෙන් 25%) පුරුෂ පක්ෂයේ මානසික සුබ සාධනයෙහි ඌණතාවය (33%) කාන්තා පක්ෂයේ එම ඌණතාවයට (19%) වඩා වැඩි වේ. පුරුෂ පක්ෂයේ මානසික සුබ සාධනයෙහි ඌණතාවය ප්‍රබල ලෙස සියලුම දර්ශක තුනටම අනුව හෙලිදරව් වේ. එනම් ජීවිතයේ අරුත හෝ අරමුණ පිළිබඳ පැහැදිලි අවබෝධය, ජීවිතයේ තෘප්තිමත් භාවය පිළිබඳ අරුත සහ ජීවිතයෙහි අරුත ලබාදෙන්නේ කුමක්ද යන්න පිළිබඳ පැහැදිලි අදහසක් තිබීම යන කරුණු තුන වේ. පවුලේ ප්‍රධානියා වශයෙන් නිවසේ දුෂ්කර අවස්ථාවලදී තමාගේ රැකියාවේ ස්වභාවය අනුව දැරීමට ඇති වගකීම් තුළින් ඇතිවන පීඩනය නිසා ඔවුන්ගේ මානසික සුභ සාධනය පිළිබඳ ඌණතාවය ඇතිවන බව පුරුෂ පක්ෂය ප්‍රකාශ කරන ලදී

"මම රස්සාවක් කරන එක අපේ පවුලට වැදගත්. අපි ගොවිතැන් තටයුතු කරන්නේ පරම්පරාවෙන්. අත්දැකීමෙන් තමයි ගොවිතැන් කරන්නේ. අපේ මහන්සිය තිබුනට සමහර වෙලාවට පොළවත් එක්ක හැප්පෙන්න අමාරුයි."

(අවුරුදු 43ක පිරිමියෙක්)

තව දුරටත් බොහෝ කාන්තාවන් ජීවිතයේ අරුතට හේතුවන කරුණු පිළිබඳව පිරිමින්ට වඩා තරමක් දුරට පැහැදිලි අවබෝධයක් ඇති බව ඔවුන්ගේ ප්‍රකාශ වලින් පැහැදිලි විය. මෙම ජීවිත අරුත පිළිබඳ අවබෝධය පුද්ගල නිශ්‍රිත සුබ සාධනයට දායක වන බව විද්‍යාමාන වේ.

---

[26] දර්ශක හා විචල්‍යයන් මගින් පුද්ගල නිශ්‍රිත සුබ සාධනය පිළිබඳ ඌණතාවය - ඇමුණුම් 04 බලන්න.

[27] දර්ශක හා විචල්‍යයන් මගින් පුද්ගල නිශ්‍රිත සුබ සාධනය පිළිබඳ ඌණතාවය - ඇමුණුම් 04 බලන්න.

[28] සමන් ඊ(2007), මනෝවිද්‍යාත්මක සහ පුද්ගල නිශ්‍රිත සුබ සාධනය - ජාත්‍යන්තර වශයෙන් සංසන්දනාත්මක දර්ශක පිළිබඳ යෝජනාව, ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලය, ඔක්ස්ෆර්ඩ්.

[29] ජීවිතයේ අරුත පිළිබඳ අදහස විශිෂ්ඨ ලෙස සම්පූර්ණ කිරීම සඳහා උත්සහ ගැනීමේ හැකියාවः ආත්ම නිර්නයණය පිළිබඳ න්‍යාය - රයන් සහ ඩෙසී 2001.

[30] ජීවිතයේ අරමුණ සහ පැහැදිලි අරුත, තෘප්තිමත් අරුත, ජීවිතයට අරුතක් ලබා දෙන්නේ කුමකින්ද යන බව පිළිබඳ පැහැදිලි අවබෝධය.

[31] දර්ශක හා විචල්‍යයන් මගින් මනෝවිද්‍යාත්මක සුබ සාධනය පිළිබඳ ඌණතාවය - ඇමුණුම් 3 බලන්න.

බොහෝ කාන්තාවන් දරුවන්ට හොඳ අධ්‍යාපනයක් තිබීම, ඔවුන්ට හොඳ රැකියාවක් තිබීම, නිවසේ යහපත් ආදායම් තත්ත්වයක් පැවතීම, හොඳ නිවසක් තිබීම යන කරුණු ජීවිතයේ තෘප්තිමත් භාවයට හේතුවන කරුණු වශයෙන් දක්නට ලැබේ. මෙයින් අනාවරණය කරනු ලබන්නේ ජීවිතයේ තෘප්තිමත් භාවය පිළිබඳ ඔවුන් සිතන අන්දම සහ පුද්ගල නිශ්‍රිත සුබ සාධනය අතර ඇති අන්තර් සබඳතාවය වේ. ඔවුන් තෘප්තිමත් භාවයට පත්වන ජීවිතයේ විවිධ අංශ තුලින් ඔවුන් හට ජීවිතයේ අරුතක් ලැබෙන්නේ කුමන කරුණු ඇසුරින්ද යන්න පිළිබඳ මනා අවබෝධයක් ලැබී ඇති බව මෙයින් හෙලිදරව් වේ.

> "මට මගේ නිවස සම්පූර්ණයෙන් ඉදිකර ගැනීමට නොහැකිවීම පිලිබඳ ටිකක් කණගාටුයි. එහෙත් මම මගේ දරුවන්ව හොඳට හැදුවා. හොඳට ඉගැන්නුවා. දැන් ඔවුන් සමාජයේ හොඳ ජීවිත ගත කරනවා. එය මගේ විශාලතම ජයග්‍රහනයයි."
>
> (අවුරුදු 51ක කාන්තාවක්)

විවිධ පුද්ගලයන්ගේ අවධානයට යොමුවන විවිධ පෙළඹවීම් නිසා ජීවිතයේ අරුත පිලිබඳ ඌණතාවයන් මතුවිය හැකි අතර ඒ හේතුවෙන් ඔවුන්ගේ මානසික සෞඛ්‍යය පිලිබඳ එය යහපත් හෝ අයහපත් අයුරින් බලපෑ හැක. (සමන් 2007) ජීවිතයේ අරුත සහ රැකියාව අතර යහපත් සබඳතාවක් පැහැදිලිවම පෙනෙන්නට ඇති බව මෙම අධ්‍යයනයෙන් හෙලි වූ කරුණකි. කෙසේ වුවද රැකියාවල නියුතු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය අතරින් පිරිමින් (77%) ජීවිතයේ තෘප්තිමත් අරුතක් සොයාගැනීමේ දර්ශකයට අනුව පිරිමින් වැඩි පිරිසක් වඩාත් මානසික දිළිඳුභාවයට හෙවත් ඌණ තෘප්තිමත්භාවයක පසුවන බව හෙලි වේ. සමාජයේ තමා වෙත පැවරී ඇති පවුලේ අවශ්‍යතා ඉටුකිරීම වැනි වගකීම් නිසා බොහෝ පිරිමින් මානසික පීඩනයට පත්ව ඇති බව ගුණාත්මක දත්ත විශ්ලේෂණයේදීද පිළිබිඹු විය.[32] එම නිසා පිරිමින් තමාට ජීවිතයේ අරුත ලබාදෙන්නේ කුමන කරුණු වලින් දැයි වටහා ගැනීමට අපොහොසත් වී ඇත. එනම් තම රැකියාව/කාර්යය තුලින් ඔවුන් තෘප්තියක් ලැබීමේ අවස්ථා නොමැති බවද රැකියාවක් කළයුතු වීම නිසා එය සිදු කරන බවද පෙනෙන්නට තිබේ.

> "මෙච්චර කාලයක් තිස්සේ ජීවිතේට අරමුණක් සෙව්වා. තාමත් හොයනවා. අපි හැමදාම හිතන්නේ කවදාහරි මේ වලෙන් ගොඩ එන්න ඕනෑ කියලයි. අපි හරියට අසරණ වෙනවා. අපේ ජීවිත ගැන අපිට ඕනෑ විදියට තීරණ ගන්න අපිට නිදහසක් නැහැ. උදේම ගෙදරින් ගියාම එන්නේ හවසට. විවේක ගත්තොත් අපිට කන්න ලැබෙන්නේ නැහැ."
>
> (අවුරුදු 35ක පිරිමි කෙනෙක්)

ජීවිතයේ අරුත පිලිබඳ කාන්තාවන්ගේ අවබෝධය වෙනත් ස්වරූපයක් ගනී. බොහෝ කාන්තාවන්[33] ආදායම් උත්පාදන කටයුතුවල නිරත නොවෙති. තව දුරටත් තමා කොතරම් අධ්‍යාපනය ලැබූ කුසලතා සහිත අය වුවද සමාජය විසින් තමා වෙත පවරා ඇති සම්ප්‍රදායික ස්ත්‍රී පුරුෂ සමාජභාවිය කාර්යයන් නිසා රැකියාවක් කිරීමෙන් වැලකීමට සිදුව ඇති බව කාන්තාවන්ගේ විශ්වාසය වේ. මෙය අධ්‍යයනයෙන් ද අනාවරණය වේ. එනම් ඔවුන් ජීවත්වන සංස්කෘතික සන්දර්භය තුළ කාන්තාවන් පිරිමින්ට වඩා කොතරම් උගත් අය වුවද කාන්තාවන් නිවසේ රැඳී දරුවන් රැක බලා ගැනීමේ නිරත විය යුතු බව මෙන්ම තම ජීවනෝපායට සහය දිය යුතු බව පිරිමින් හැමවිටම අපේක්ෂා කරයි. පවුලේ රැකවරණය උදෙසා කාන්තාවන් රැකියාවක් නොකිරීම තුලින් කාන්තාවන්ගේ ආර්ථික ස්වාධීනත්වයට මෙන්ම තීරණ ගැනීමේ හැකියාවද වැළැක්වීමට බලපාන බව අධ්‍යයනයේ පිලිබිඹුව ඇත.

> "මගේ ස්වාමියා මා රැකියාවක් කරනවාට කැමති නෑ. ඔහුට ඕනෑ කරන්නේ මම ගෙදර ඉඳගෙන දරුවන් බලා ගැනීමයි. එපමණක් නොව ඔහුගේ දෙමාපියන් බලාපොරොත්තු වන්නේද එයමයි. නමුත් කසාද බඳින්න කලින් මා රැකියාවක් කළා. ඒ දවස්වල මට ඕනෑ විදියට වියදම් කරන්න මගේ අතේ මුදල් ඇති වෙන්න තිබුනා. නමුත් මට දැන් මහත්තයාගේ මුදල් මත යැපීමට සිදු වී තිබෙනවා. මට රැකියාවක් තිබුනා නම් නිවසේ වියදම් දැරීමට මටත් උදව් කරන්න පුළුවන්. නමුත් ඔහුට එය කල හැකි බව ඔහු පවසනවා."
>
> (අවුරුදු 40ක කාන්තාවක්)

---

[32] සම්ප්‍රදායිකව පුරුෂ පක්ෂය පවුලේ ආදායම් උපයන්නා වේ. ඔවුන් ආක්‍රමශීලී මෙන්ම පාලකයාද වේ.

[33] ස්ත්‍රී පක්ෂය නිවසේ ඉවුම් පිහුම්, පිරිසිදු කිරීම් හා දරුවන් රැක බලා ගැනීමේ කාර්යයන් හි නිරත වේ. ඔවුහු යටහත් පහත් මෙන්ම දුර්වල අය.

ජීවිතයේ අරුත/වැදගත්කම නිර්වචනය කිරීම සඳහා න්‍යායන් ගොඩනැගීමට බොහෝ පර්යේෂකයන් උත්සහ දරා ඇත. ජීවිතයේ වඩා හොඳ අරුතක්/වැදගත්කමක් තිබීම සහ ජීවිතයේ තෘප්තිමත්භාවය හා සතුට සම්බන්ධව ධනාත්මක සබඳතාවක් ඇති බව මෙම පර්යේෂකයන්ගේ සොයාගැනීම විය. (ස්ටගර් එෆ් එම් සහ අනිකුත් අය 2006) ජීවිතයේ අරුත/වැදගත්කම තුලින් සතුට සහ ජීවිත තෘප්තිමත්භාවය සඳහා පැහැදිලි දායකත්වයක් ලබාදෙන බව ද්විමය ප්‍රතික්‍රමණ විශ්ලේෂණයේදී (The Binary Logistic Regression) තහවුරු විය.[34] ජීවිතයේ අරුත/වැදගත්කම පිලිබඳ ඌණතාවයකින් පෙළෙන ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම සතුට පිළිබඳව එමෙන් තුන් ගුණයක් ඌණතාවයකින් පෙළිය හැකි බවද සම්පූර්ණ ජීවිත තෘප්තිමත්භාවය පිලිබඳ පස් ගුණයක ඌණතාවයකින් පෙළිය හැකි බවද මෙම ඌණතාවය ඇති පුරුෂ පත්ෂය දෙගුණයක් විය හැකි බවද අනාවරණය වෙ. පුද්ගල නිශ්‍රිත සුභ සාධනයෙහි අංග සහ ජීවිතයේ අරුත/ වැදගත්කම අතර ඇති සබඳතාවය මින් පිළිබිඹු වේ.

අනතුරුව භාවිතා කරන ලද ප්‍රවේශය වූයේ ස්වයං තීරණ ගැනීමේ න්‍යාය (Self Determination Theory) වේ. මෙම න්‍යාය සංවර්ධනය කරන ලද්දේ රයන් සහ ඩෙසී විසිනි. මෙම න්‍යායයෙන් ප්‍රවේණියෙන් පැවත එන මූලික අවශ්‍යතා තුනක් ජීවිතයේ අරුත/වැදගත්කම ළගා කරගැනීමේ හැකියාවට බලපාන අවශ්‍ය කරන කොන්දේසියක් බව ඉදිරිපත් කර ඇත. (රයන් සහ ඩෙසී, 2001) මෙම තුන් වැදෑරුම් මනොවිද්‍යාත්මක මූලික කරුණු නම්

ස්වාධීනත්වය - තම ජීවිතයේ ක්‍රියාකාරකම් පිළිබඳ තීරණ ගැනීම සඳහා තමාම නියෝජිතයෙක් වීම. (ස්වයං තීරණ ගැනීමේ අවශ්‍යතාවය)

හැකියාව/කුසලතාව - යම් කාර්යයක් තමාට කළ හැකි බව විශ්වාස කිරීමේ අවශ්‍යතාවය

සබඳතාවය - පුද්ගලයින් සමග ආරක්ෂිත මෙන්ම සමීප සම්බන්ධතා පවත්වන අතරතුර ස්වාධීනත්වයට ගරු කිරීම සහ හැකියාවන් පහසුකර ගැනීමේ අවශ්‍යතාවය.

ඉහත සඳහන් අවශ්‍යතා සම්පූර්ණ වුවහොත් සුභ සාධනය සහ දිරිගැන්වීම වර්ධනය වන බවද එම අවශ්‍යතා ඉටුවීම සීමා වුවහොත් එය අපගේ ජීවිතවලට අයහපත් ලෙස බලපාන බව ස්වයං තීරණ ගැනීමේ න්‍යාය මගින් ඉස්මතු කර දක්වන කරුණකි.

සමස්ථයක් වශයෙන් ස්වයංතීරණ ගැනීම සම්බන්ධව තොරතුරු දායකයින්ගේ ඌණතාවය අවම බව දක්නට ලැබේ. මෙම මානසික සුබ සාධනය පිළිබඳ ඌණතාවය පිළිබඳව ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය පිළිබඳව සැලකිල්ලට ගතහොත් සම්බන්ධතාවය පිලිබඳ දර්ශකය තුළින් හැර ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය අතර පැහැදිලි වෙනසක් දක්නට නොලැබෙන බව පැහැදිලි වේ. අධ්‍යයනයෙන් හෙළිදරව් වන පරිදි බොහෝ පිරිමින් (25%) කාන්තාවන් (12%) හා සැසඳීමේදී මානසික දිළිඳුභාවයෙන් පෙළෙන බව අනාවරණය වේ. එය තවදුරටත් පැහැදිලි කිරීමේදී කාන්තාවන් හා සැසඳීමේදී පිරිමින් ඔවුන් සමග නිතර සමාජ සම්බන්ධතා පවත්වන පුද්ගලයන් සමග හෝ හඳුනාගන්නා පුද්ගලයන් සමග සාමූහිකව කටුයතු කිරීමේ අඩු ප්‍රවණතාවයක් දක්වන බව අනාවරණය වේ. මෙය තවවුරටත් එක් එක් අංශවලට සුවිශේෂ වූ ජීවිත තෘප්තිමත්භාවය පිලිබඳ තොරතුරු වලින් පිරිමි පක්ෂය මිතුරන් සිටීම සම්බන්ධව එතරම් තෘප්තිමත් නොවිය හැකි බව ප්‍රකාශවේ. මෙම තොරතුරු වලින් පිරිමින් වෙනත් විධිමත් සංවිධාන සමග සබඳතා පැවැත්වීමේ ප්‍රමුඛතාවක් දක්නට ලැබෙන අතර කාන්තාවන් සංවේදී/හැගුම්බර සබඳතාවලට මනාපයක් දක්වන බව පෙන්වා දිය හැක.

> "අපි යමෙක්ව මුණගැසුනු ගමන් ළග සබඳතාවක් ඇති කර ගන්නේ නැහැ. සාමාන්‍යයෙන් මට යමෙක්ව තේරුම් ගැනීමට ටිකක් කල් ගන්නවා"
>
> (අවුරුදු 41ක පිරිමි කෙනෙක්)

නියැදිය තුළ සිටි ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේම තොරතුරු දායකයින්ගෙන් 80% සිය ජීවිතවල ස්වාධීනත්වය/ස්වයං පාලනයට ඇති අයිතිය භුක්ති විඳින බව හෙලි වේ. එම ස්වාධීනත්වය නොමැති පිරිස තුළින් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේම 10% කට ජීවිත කෙසේ ඉදිරියට ගෙන යා යුතුද යන කරුණ පිලිබඳ තීරණ ගැනීමේ නිදහස නොමැති බව පවසන ලදී. එමෙන්ම ස්වාධීනත්වය පිලිබඳ අදහස් ප්‍රකාශ කිරීමේදී පිරිමින්ට

[34] දර්ශක හා විචල්‍යයන් මගින් මනෝවිද්‍යාත්මක සුබ සාධනය පිළිබඳ ඌණතාවය - ඇමුණුම් 03 බලන්න.

සාපේක්ෂව කාන්තාවන් තුල නිදහස අඩු කම පැහැදිලිව පෙනෙන්නට තිබුනි. එක් එක් අංශ පිළිබඳව ජීවිතයේ තෘප්තිමත්භාවය පිලිබඳ විමසීමේදී ස්වාධීන තෝරාගැනීම් සහ තම ජීවිත පාලනය කිරීම් සම්බන්ධව කාන්තාවන් එතරම් තෘප්තිමත් භාවයක් නොදක්වන බව විශ්ලේෂණයේදී විද්‍යාමාන විය. ගුණාත්මක දත්ත තුලින් මෙය කාන්තාවන්ගේ විරැකියාව හා සබඳතාවක් දක්වන බව අනාවරණය විය. සමීක්ෂණයෙන් අනාවරණය වන පරිදි කාන්තාවන්ගෙන් සමාජය අපේක්ෂා කරන දරුවන් රැක බලාගැනීමේ කාර්යභාරය නිසා ඔවුන්ගේ ප්‍රධාන ආදායම් උපයන්නා වශයෙන් තම ස්වාමි පුරුෂයාට ආර්ථික වශයෙන් යටහත්වීමට සිදු වේ. අධ්‍යයනයෙන් හෙලිදරව් වන පරිදි ප්‍රධාන ආදායම් උපයන තම ස්වාමි පුරුෂයාට කාන්තාවන් සහයෝගය දෙන අතර ඔහුගේ මානසික පීඩනය වැඩිවන අයුරු කිසිවිටෙකත් වෙනත් විකල්ප යෝජනා නොකරයි.

තමා හැකියාවන්ගෙන් සම්පූර්ණ බව පිළිබඳ හැඟීමක් ඇති කර ගැනීමට පිරිමින් තරමක් අකමැත්තක් දක්වන නමුත් කාන්තාවන් තමා මනා හැකියාවන්ගෙන් යුක්ත බව සිතන අතර අනෙකුත් අය ඔවුන් හැකියාවන් ඇති අය බව ප්‍රකාශ කිරීම සම්බන්ධව තරමක අකමැත්තක් දක්වයි. තොරතුරු දායකයින්ගේ රැකියා තත්ත්වය මේ සමග සබඳතාවක් දක්වන බව ගුණාත්මක දත්ත වලින් නැවත වරක් පෙන්නුම් කරයි. තමා හට රැකියාවට සුදුසු හැකියාවන් නොමැති වුවද, බොහෝ පිරිමින් සමාජයීය සහ පවුලේ බලපෑම් නිසා වේතන ලබන රැකියාවල නිරත වීමට පෙළඹෙන නමුත් බොහෝ කාන්තාවන් (73%) රැකියා විරහිත වේ. බදුල්ල දිස්ත්‍රික්කයෙහි ජනතාව තම ජීවනෝපාය ලෙස කෘෂිකාර්මික ක්‍රියාකාරකම්වල නිරත වේ. නියැදියට අයත් වූ පිරිසෙන් 45% ක් ගොවීන් හෝ කෘෂිකාර්මික ක්ෂෙත්‍රයේ වේතන ලබන සේවකයන් වේ. නියඟයන්, භූමියේ ඇති කඳු සහිත ස්වභාවයන් වැනි භූගෝලීය දුෂ්කරතා  ජීවනෝපාය සම්බන්ධ ක්‍රියාකාරකම් මන්දෝත්සාහී කරන සාධක ලෙස ක්‍රියාකරන අතර බල රහිතභාවය හා නොහැකියාව පිළිබඳ හැඟීම් සම්බන්ධව මෙම සාධක දායක විය හැකිය.

මෙම අවශ්‍යතා තුන සාමුහිකව ගත්කල ස්වයං නිර්ණය හෙවත් ස්වයං අධිෂ්ඨානය සංයුතියක් ලෙස අවබෝධ කර ගැනීමට හැකි බව මෙම විශ්ලේෂණයෙන් හෙලිදරව් වේ. මෙය සංඛ්‍යාන විද්‍යාත්මකව පැහැදිලි නොවුනද, සමස්ථ ජනගහණයෙන් 30% පමණ ස්වයං නිර්ණය පිළිබඳ ඌණතාවයකින් පෙළෙන බව පෙනේ. එහෙත් එම ඌණතාවය සමස්ථ ජීවිත තෘප්තිමත්භාවය කෙරෙහි සැලකිය යුතු දායකත්වයක් ලබාදෙන බව පැහැදිලි වන කරුණකි. ස්වයං නිර්ණයෙහි ඌණතාවක් නොදක්වන පිරිසට වඩා එම ඌණතාවයෙන් පෙළෙන පිරිස ද සිව් ගුණයකින් වැඩි බව අපූර්ව ලෙස හෙලිදරව් වේ.[35]

ජීවිතයේ අරුත හා ස්වයං නිර්ණය/ස්වයං අධිෂ්ඨානය පිළිබඳ සංයුක්ත මිනුම් දණ්ඩක් වශයෙන් මනෝවිද්‍යාත්මක සුබ සාධනය සාධක විශ්ලේෂණය (Factor Analysis) මගින් තවදුරටත් විශ්ලේෂණය කරන ලදී. සාරාංශයක් ලෙස මනෝවිද්‍යාත්මක සුබ සාධනය සම්බන්ධව තොරතුරු දායකයින්ගේ ඌණතාවය ප්‍රමාණාත්මකව අඩු බව (40%) බව හෙලිදරව් වේ. නමුත් මෙම පිරිසෙන් වැඩි ප්‍රමාණයක් පිරිමින් බව එනම් (49%) සහ කාන්තාවන් (35%) බවත් පැහැදිලිවම දක්නට ලැබේ. ස්ත්‍රී පුරුෂභාවයෙහි වෙනසක් නොමැතිව මනෝ විද්‍යාත්මක සුබ සාධනය ජීවිතයේ සතුට හා ජීවිතයේ තෘප්තිමත්භාවයෙහි ඌණතාවය පිලිබඳව සබඳතාවක් දක්වන බව තව දුරටත් අනාවරණය වේ.

අවසන් වශයෙන් මෙම විශ්ලේෂණයෙන් අනාවරණය වන පරිදි පුද්ගල නිශ්‍රිත හා මනෝවිද්‍යාත්මක සුභ සාධනය යන කරුණු සංයුක්ත මිනුම් දඬු ලෙස භාවිතා කිරීම තුළින් මනෝවිද්‍යාත්මක සුභ සාධනය සංයුතියක් ලෙස විශ්ලේෂණය කල හැකි බව පෙනේ. මෙම සංයුක්ත මිනුම් දඬු තුළින් මුළු ජනගහණයෙන් (97%) මානසික සුභ සාධනය පිලිබඳව යහපත් තත්ත්වයෙන් සිටින බව අනාවරණය වී ඇත.

[35] දර්ශක හා විචලයයන් මගින් මනෝවිද්‍යාත්මක සුබ සාධනය පිළිබඳ ඌණතාවය - ඇමුණුම් 03 බලන්න.

## 5. සාකච්ඡාව සහ සබඳතාවය



මානසික සුභ සාධනය පිළිබඳ ස්ත්‍රී පුරුෂ සමාජභාවිය අසමානතා බොහෝ විවේචනවලට බඳුන් වූ කරුණකි.[36] විශේෂයෙන්ම සතුට සම්බන්ධ අංග පිළිබඳ මෙම විවේචන සිදුවේ. පුද්ගලයින්ගේ අගයයන් සහ ඔවුන් ජීවිතයේ ද්‍රව්‍යයමය හා ද්‍රව්‍යයමය නොවන අංග පිළිබඳ අගයන ප්‍රමාණය පිළිබඳව පුද්ගල නිශ්‍රිත සහ මනෝවිද්‍යාත්මක සුබ සාධනය යථාර්තවාදීව ගවේෂණය කිරීම තුළින් වටහා ගැනීමට හැක. එම අනාවරණය සුභ සාධනය පිළිබඳ වැඩ සටහන් සහ ප්‍රතිපත්ති සැලසුම් කිරීමට සහ සංවර්ධනය කිරීමට උපකාරී වේ. මෙම පත්‍රිකාවෙහි අපෙක්ෂාව සුබ සාධනයෙහි මට්ටම් නගා සිටුවීම අරමුණු කරගෙන පවතින්නා වූ සහ නිර්මාණය කරන වැඩ සටහන් සඳහා උපකාරි වන පිණිස පර්යේෂණ විග්‍රහ තුලින් සාක්ෂි සැපයීමවේ.

මෙම විශ්ලේෂණයේදී පැහැදිලි වන කරුණක් නම් බදුල්ල දිස්ත්‍රික්කයෙහි බහුතරයක් ජනතාවට මනෝ විද්‍යාත්මක සුබ සාධනයෙහි ඌණතාවයක් නොපවතින බවය. කෙසේ වුවද, පුද්ගල නිශ්‍රිත සහ මනෝවිද්‍යාත්මක දර්ශක ගැඹුරු ලෙස විශ්ලේණය කිරීමෙන් අනාවරණය වන කරුණක් වන්නේ දර්ශකයන් අතර මෙම සුබ සාධන ඌණතාවයන්හි මට්ටම් පිළිබඳ පැහැදිලි වෙනසක් දක්වන බව මෙන්ම ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂය අතරද පැහැදිලි වෙනසක් දක්නට ලැබෙන බවය. මෙහිදී අනාවරණය වන්නේ මෙම අංශ පිළිබඳව සංයුක්ත මිනුම් දණ්ඩක් ලෙස සලකනවාට වඩා තනි තනි විචල්‍යයන් ලෙස විමසීමේ වැදගත්කම වේ. විවිධ විචල්‍යයන් හා දර්ශක සම්බන්ධ කර ගනිමින් සංයුක්ත මිනුම් දඬු සකස් කර ඇත. මෙවැනි සංයුක්ත සූචකයන් සැකසීමේදී දත්ත සාරාංශගත කිරීම සඳහා යම් යම් කොටස්වල අත්හැර දැමීමක් සිදු වුවහොත් දත්ත හිඟතාවයක් සිදුවිය හැකි අතර එය අවසන් ප්‍රතිඵලයට බලපායි. එම නිසා අවසන් සූචකයට ඇතුළත් වන එක් එක් දර්ශකයන් ගැඹුරින් විශ්ලේෂණය කළ විට ඒ හා සැසඳීමේදී අවසන් සූචකයෙහි සුළු වෙනස්කමක් ඇති විය හැක. එම නිසා අධ්‍යයනයේ සොයාගැනීම් සුළු පරිමාණයෙන් මෙන්ම පුළුල් පරිමාණ මට්ටම් වලින් සලකා බැලීම වැදගත් වේ.

මෙම අධ්‍යනයේදී සමහර පුද්ගල නිශ්‍රිත සහ මනෝවිද්‍යාත්මක සුබ සාධනය පිළිබඳ දර්ශක තුළින් ස්ත්‍රී පුරුෂ සමාජභාවිය වෙනස්කම් පැහැදිලවම ඇති බව අනාවරණය විය. පුද්ගල නිශ්‍රිත සුබ සාධනය පිළිබඳ දර්ශක සහ විචල්‍යයන්ට අනුව කාන්තාවන් පුද්ගල නිශ්‍රිත සුබ සාධනයෙහි වැඩි ඌණතාවයක් දක්වන බව අනාවරණය වූ එක් කරුණකි. කාන්තාවන්ගේ අසතුට බොහෝ විට අධ්‍යාපනය, ආදායම, දරුවන් වැනි සමාජ ආර්ථික කරුණු මත රඳා පවතින අතර ජීවිතයේ පිරිමින්ගේ අසතුට පැහැදිලිවම ඔවුන්ගේ රැකියාවන් සමග සම්බන්ධ වේ.

මෙය සාම්ප්‍රදායික ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයෙන් සමාජය අපේක්ෂා කරන ස්ත්‍රී පුරුෂ සමාජභාවිය කාර්යයභාරයන් පිළිබඳ ඉස්මතු කරයි. සමාජ සම්මතයන් අනුව පවුලේ රැකවරනය සැලසීමේ වගකීම දැරීමට කාන්තාවන්ට සිදුවේ. බදුල්ල දිස්ත්‍රික්කයේ විශාල වශයෙන් මෙම තත්ත්වය දක්නට ලැබේ. එනම් බහුතරයක් කාන්තාවන් රැකියා විරහිත වන අතර පවුල් ප්‍රධාන රැකවරණය සලසන්නා මෙන්ම පවුලේ ප්‍රධාන ආදායම් උපයන්නා හට

---
[36] සමන්(2007) බලන්න.

අවශ්‍ය සහයෝගය සපයන්නාද වේ. මෙම කාන්තාවන්ගේ විරැකියාව මානසික සුභසාධනය පිළිබඳ සමහර දර්ශකයන්වල ඌණතාවය පිළිබඳව අනාවරණය කරයි. ආර්ථික ස්වාධීනත්වය හා රැකියාවන් තෝරාගැනීමේ නිදහස කාන්තාවන්ට සීමා සහිත බැවින් ඒ සම්බන්ධ තම අදහස් හෝ මතවාද ප්‍රකාශ කිරීම සම්බන්ධව බොහෝ ඌණතාවයක් දක්වයි. ඔවුන් වැඩිපුර අධ්‍යාපනයක් ලැබූ අය වුවද සම්ප්‍රදායික සමාජ ක්‍රමය සහ පවුලේ අනෙකුත් සාමාජිකයන්ගේ අපෙක්ෂාව පරිදි ඔවුන් නිවසේ රැඳී පවුලේ රැකවරණය සැලසිය යුතු වේ

ජීවිතයේ විශේෂ අංග පිළිබඳ කාන්තාවන්ගේ තෘප්තිමත්භාවය සහ ඔවුන්ගේ ජීවිතයේ අරුත තුළ ධනාත්මක සබඳතාවක් ඇති බව සිත්ගන්නා සුළු පරිදි මෙම අධ්‍යයනයෙන් අනාවරණය වී ඇත. එමෙන්ම තම දරුවන් උසස් ලෙස අධ්‍යාපනය ලැබීම, ඔවුනට හොඳ රැකියාවක් තිබීම, පවුලේ යහපත් ආර්ථිකයක් තිබීම, හොඳ නිවසක් තිබීම යන කරුණු සම්පූර්ණ වූ විට ජීවිතයේ අරුතක් ලැබෙන අංග පිළිබඳව ඔවුන්ට මනා වැටහීමක් ලැබේ. ඔවුන් නිවසේ රැඳී සිට දරුවන් හා පවුල රැක බලා ගැනීමේ කටයුතුවල නිරත වීමට සිදු වුවද එම කාර්යය ඔවුන් පිළිගන්නා අතර එය ඔවුන්ගේ ජීවිතයේ අරුත බව වටහා ගනී. එම නිසා කාන්තාවන් රැකියාවක නිරත වීමේ ආවස්ථික පිරිවැයක් ඇත. එනම් නිවසේ රැඳී සිට දරුවන් රැක බලා ගනිමින් තම ස්වාමියාගේ වැඩට සහයෝගය දීම ඔවුන්ට රැකියාවක් කර ලබන ආදායමට වඩා වාසිදායක වන බැවිනි.

බදුල්ල දිස්ත්‍රික්කයේ පුරුෂාධිපත්‍යය කුටුම්භ/පවුල් ව්‍යුහය තුළ කාන්තාවන්ගේ ජීවිතයට අරුතක් ලබාදෙන කරුණු සහ ඔවුන්ගේ විරැකියාව අතර ඇති සබඳතාවය පිළිබඳ මෙම අධ්‍යයනය අවධානය යොමු කරයි. එම නිසා සුබ සාධනය නගා සිටුවීම, පිණිස සිදු කරන වැඩ සටහන් වලදී කාන්තාවන්ට නිවසේ රැඳී සිට කළ හැකි ආදායම් උත්පාදන කටයුතු පිළිබඳ අවස්ථා නිර්මාණය කිරීමට සැලකිලිමත් විය යුතුවේ. එවිට ඔවුන් හට තම දරුවන් රැක බලා ගන්නා අතරම තම පවුලට අතිරේක ආදායමක් ලබා ගැනීමටද ආර්ථික ස්වාධීනත්වයක් ලබා ගැනීමටද හේතුවනු ඇත. ජීවිතයේ අරුත සහ සබඳතා පිළිබඳ මනෝවිද්‍යාත්මක සුබ සාධන දර්ශක තුලින් පිරිමින් ප්‍රබල ලෙස මනෝවිද්‍යාත්මක සුබ සාධනය පිළිබඳ ඌණතාවයකින් පෙළෙන බව වාර්තා වේ.

පිරිමින්ට පවුලේ ප්‍රධාන ආදායම් උපයන්නා ලෙස පවතින පීඩනය නිසා තම ජීවිතයේ අරමුණ, ජීවිතයේ තෘප්තිමත්භාවයට අදාල කරුණු හා ජීවිතයට අරුතක් ලබාදෙන කරුණු සම්බන්ධව පැහැදිලි හැඟීමක් නොමැති බව මෙම අධ්‍යනයෙන් පෙන්වා දෙයි. එමෙන්ම පිරිමින්ට සම්ප්‍රදායිකව තම පවුලේ අවශ්‍යතා සපුරාලීමට රැකියාවක් කිරීමට සිදු වුවද ඔවුන් හැමවිටම එම රැකියා වලින් සතුටු නොවේ. මෙම සිද්ධිය බදුල්ල දිස්ත්‍රික්කයට මෙන්ම රැකියා අවස්ථා සීමා සහිත වූ මෙවැනි සමාන ප්‍රදේශ වලටද කෘෂිකාර්මික ක්ෂෙත්‍රයේ දුෂ්කර කම්කරු රැකියා වල නියුතු පිරිමින්ටද අදාල විය හැක. එම නිසා පිරිමින් හට බොහෝ වෙහෙසකාරී ශ්‍රමිකයන් ලෙස දුෂ්කර කාර්යයන් හි නිරත වීමට සිදු වන බව පෙනේ.

සමාජ සබඳතා තුළ ජීවිතයේ තෘප්තිමත්භාවය පිළිබඳ පිරිමින්ගේ සංජානනය/හඳුනාගැනීම පැහැදිලි ලෙස ඌණතාවයක් දක්වන බව අනාවරණය වී ඇත.[37] පවුලේ එකම ආදායම් උපයන්නා ලෙස පිරිමින්ගේ කාර්යයභාරය තව දුරටත් ඔහු හුදෙකලා කරන අතර එම නිසා ඔවුන්ගේ සමාජ සබඳතා තරමක් දුරට හීනවන බව පෙනේ.

මානසික සුබ සාධනය පිළිබඳ සාහිත්‍යයෙන් හෙළිදරව් වන පරිදි කාන්තාවන් සමග සංසන්දනය කිරීමේදී පිරිමින් වැඩි පිරිසක් සමාජයේ පුද්ගලයන් සමග විධිමත් සබඳතා ඇති කර ගැනීමට රුචිකත්වයක් දක්වන බව ද කාන්තාවන් තමාට සමාජ සහයෝගය ගත හැකි තම සහය සේවකයන්, මිතුරන්, ඥාතීන්, වැඩිහිටි දරුවන් වැනි අය සමග සමීප/සංවේදී සබඳතාවක් පැවැත්වීමට රුචිකත්වයක් දක්වන බවද හෙලි වේ.

කෙසේ වුවද පිරිමින්ගේ මනෝ විද්‍යාත්මක සහ මානසික සුබ සාධනය සඳහා රැකියාව සහ සමාජ සබඳතා කෙතරම් දුරට බලපාන්නේද යන බව පිළිබඳව තව දුරටත් විශ්ලේෂණය කිරීම සඳහා මෙම නියැදිය ප්‍රමාණවත් නොවේ. එමෙන්ම මෙම ඌණතාවයන් පුළුල් ලෙස මැන බැලීම සඳහා පුළුල් ගුණාත්මක අධ්‍යනයක අවශ්‍යතාවය මනාව පැහැදිලි වේ.

[37] කාලයක් මුළුල්ලේ පුද්ගලයන් අතර ඇති සමාජ සබඳතා පිළිබඳ එකතුව - මෙය ධනාත්මක (යහපත්) හෝ ඍණාත්මක/අයහපත් විය හැක.



## 6. නිගමනය

ශ්‍රී ලංකාවේ බදුල්ල දිස්ත්‍රික්කය තුළ මානසික සුබ සාධනය සම්බන්ධව කාන්තාවන් හා පිරිමින් ලබන අත්දැකීම් වෙනස් වන අතර එහි ඇති සංකීර්ණභාවය පිළිබඳ මෙම අධ්‍යයනයෙන් අනාවරණය කරයි. බදුල්ල ද්ස්ත්‍රික්කයේ මුළු ජනගහනයෙන් 97% කට වැඩි ප්‍රමාණයක් මානසික සුබ සාධනය පිලිබඳ යහපත් මට්ටමක සිටින බව මෙම අධ්‍යනයෙන් හෙලිදරව් වුන තොරතුරු අනුව තහවුරු වේ. කෙසේ වුවද කාන්තාවන් හා පිරිමින් අතර මානසික සුබ සාධනයේ මට්ටම්වල වෙනසක් දක්නට ලැබේ. තවද, පිරිමින් හා කාන්තාවන් මානසික සුබ සාධනය අත් විඳින ආකාරය පිළිබඳ සමාජානුයෝජන ක්‍රියාවලියේ බලපෑම මෙම අධ්‍යයනයෙන් ඉස්මතු කර දක්වයි. කාන්තා තොරතුරු දායකයින් දරුවන් රැකබලාගැනීමේ සාම්ප්‍රදායික කාර්යයභාරයට අමතරව වැඩි ආර්ථික ශක්තියක් අපේක්ෂා කරන අතර කුටුම්භයේ පුරුෂාධිපත්‍ය රාමුව වෙනස් කිරීමට අකමැති බව අධ්‍යයනයෙන් අනාවරණය වී ඇත.

සාහිත්‍යයෙහි සඳහන් පරිදි මනෝවිද්‍යාත්මක සුබ සාධනය තක්සේරු කර බැලීම සඳහා පුද්ගල නිශ්‍රිත සුබ සාධනය හා මනෝවිද්‍යාත්මක සුබ සාධනය අතර ඇති සබඳතාවය මෙම අධ්‍යයනයෙන් විමසා බලයි. එසේම මෙම අංශ දෙක තුළ විචල්‍යයන් සහ දර්ශකයන් අතර අන්තර් සබඳතාවයක් ඇති බවද සමහර අවස්ථාවලදී එම අංශ දෙක එකිනෙකට අනුපූරණය වන බවත් අනාවරණය වේ. කෙසේ වුවද සමස්තයක් ලෙස ජීවිතයේ අරුත, සතුට සහ ජීවිතයේ පූර්ණ තෘප්තිමත්භාවය අතර ධනාත්මක සබඳතාවක් ඇති බව මෙම අධ්‍යයනයෙන් අනාවරණය වේ. පුද්ගලයන් සමස්ත ජීවිතය පිළිබඳ තෘප්තිමත්භාවයක් ලදහොත් ඔවුන් සතුටින් සිටින බව මෙන්ම ඔවුන්ගේ ජීවිතයේ අරුතක් ඇතිව දිවි ගෙවන බවද පෙනේ. මෙය තවදුරටත් පැහැදිලි කළහොත් ජීවිතයේ සුවිශේෂි අංශ පිළිබඳ තෘප්තිමත්භාවය අත් විඳින විට එය පුද්ගලයන් සතුටින් සිටීමට මෙහෙයවයි. එය වෙනස් ආකාරයකින් පැවසුවහොත් ජීවිතයේ අරුතක් සහිතව තෘප්තිමත්භාවය ළඟා කරගන්නා බව මෙම පුද්ගලයන් ප්‍රත්‍යක්ෂ කර ගැනීම වේ.

පුද්ගල ජීවිතයේ තෘප්තිමත්භාවය ඔවුන් විසින් ජීවිතය පිළිබඳ විවිධ වූ ප්‍රත්‍යක්ෂ කර ගන්නා/සංජානනය කර ගන්නා අයුරින් වන අතර අවසානයේ එය ඔවුන්ගේ මනෝවිද්‍යාත්මක සුභ සාධනය පිළිබඳ බලපාන බව අධ්‍යයනයෙන් තව දුරටත් ඉදිරිපත් කරයි.

මෙම විවිධ සංජානනයන් ජීවිතය පිළිබඳ පුද්ගලයන්ගේ ආකල්ප මගින් මතුවන්නකි. ජීවිතය පිළිබඳ විවිධ ආකල්ප ඔවුන්ව ජීවිතයේ විවිධ දේ පිළිබඳ විවිධ ආකාරයෙන් අවබෝධ/සංජානනය කරගැනීමට හේතුවන අතර ඒ සඳහා ඔවුන් විවිධ ආකරයෙන් ප්‍රතිචාර දක්වයි. මෙය ජීවිත කාලය තුලම ඔවුන් වෙනස්කිරීම සඳහා මෙහෙයවනු ලබයි. එම නිසා සුබ සාධනය ළඟාකරගැනීම පිණිස පුද්ගලයන්ගේ ආකල්ප වෙනස් කිරීමට අවශ්‍ය කුසලතා වර්ධනය කර ඔවුන් බලසතු කිරීම ඉතා වැදගත් කරුණකි.

මෙම අධ්‍යයනයෙන් ඉස්මතු කර දක්වන පරිදි ස්වාධීන තෝරාගැනීම් වැනි කරුණු කාන්තාවන්ගේ දිළිඳුභාවයට හේතුවන බව අනාවරණය වේ. එසේ වුවද, බදුල්ල දිස්ත්‍රික්ක සන්දර්භය තුළ කාන්තාවන් මනෝවිද්‍යාත්මක සුභ සාධනයෙහි "ජීවිතයේ සතුට" ලෙස සඳහන්ව ඇති එම කරුණම අගය කරන බව පැහැදිලි වේ. එම නිසා දිළිඳුකමේ යම් ඌණතාවයන් අරමුණු කරගන්නා වැඩ සටහන්, ප්‍රතිපත්ති සැලසුම් සම්පාදනය කිරීමේදී විවිධ සමාජ සන්දර්භයන් තුළ ඇති අගයයන් කෙරෙහි එම සැලසුම් ප්‍රතිපත්තීන් බලපාන අන්දම ගැන දැනුවත්ව සිටීම ඉතා වැදගත් වේ. එසේම පුද්ගලයන්ගේ තෝරාගැනීම් සමාජානුයෝජනයෙහි බලපෑම් මත නිරන්තරයෙන්ම රඳා පවතින බැවින් එම පුද්ගලයන් සමාජානුයෝජනය වීමේ ක්‍රියාවලිය පිළිබඳ මනා අවබෝධයකින් කටයුතු කිරීම ඉතා වැදගත් වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ


Alkire, S., 2007. *The Missing Dimensions of Poverty Data: Introduction to the Special Issue.* Oxford: Oxford Development Studies. pp. 347 – 359. Print.

Alkire, S., & Foster J., 2008. *Counting and Multi-dimensional Poverty Measurement,* Oxford Poverty and Human Development Institute, Working Paper No. 7. Oxford: University of Oxford. Print.

Bradburn, N.M., 1969. *The Structure of Psychological Wellbeing.* Chicago: Aldine. Print.

Csikszentmihalyi, M., 1999. "If We Are So Rich, Why Aren't We Happy." *American Psychologist,* Vol. 54(10). Print.

Diener, E., 2000. "Subjective wellbeing: The science of happiness, and a proposal for a national index." *American Psychologist.* Vol. 55(1): pp 34-43. Print.

Diener, E., 1984. "Subjective Wellbeing." *Psychological Bulletin.* Vol. 95 (3), pp. 542–575. Print.

Fodor, E., 2006. "Different Type of Gender Gap: How Women and Men Experience Poverty." *East European Politics and Societies.* Vol. 11(3) (Fall): pp 470-500. Print.

Gunewardena, D., 2004. *Poverty Measurements: Meanings, Methods and Requirements.* Colombo: Centre for Poverty Analysis. Print.

Hori, M., 2010. "Gender Differences and Cultural Contexts: Psychological Wellbeing in Cross-national Perspective." Dissertation submitted to the Graduate Faculty of the Louisiana State University and Agricultural and Mechanical College for the degree of Doctor of Philosophy. Available online:
http://etd.lsu.edu/docs/available/etd-04202010-122318/unrestricted/Hori_Diss.pdf.

Ickes, W., 1993. "Traditional Gender Roles: Do They Make, and then Break, our Relationships?" *Journal of Social Issues.* Vol. 49(3) pp. 71-85. Print.

Joshi, U., 2010. "Subjective Wellbeing by Gender." *Journal of Economics and Behavioral Studies*. Vol. 1(1) pp. 20 -26. Print.

Kahneman, D. & Krueger, B., 2006. "Developments in the Measurement of Subjective Wellbeing." *Journal of Economic Perspectives.* Vol. 20 pp 3–24. Print.

Kuumba M. B., 2001. *Gender and Social Movements.* Jaipur: Rawat Publications. Print.

Peterson, C., Park, N., & Seligman, M.E.P., 2005. "Orientations to Happiness and Life satisfaction: The Full Life versus the Empty Life." *Journal of Happiness Studies.* Vol. 6(1) pp 25–41. Print.

Roothman, B., Kirsten, D. & Wissing, M., 2003. "Gender Differences in Aspects of Psychological Wellbeing." *South African Journal of Psychology.* Vol. 33(4) pp 212-218. Print.

Rosenfield, S., 1980. "Sex Differences in Depression: Do Women Always Have Higher Rates?" *Journal of Health and Social Behavior.* Vol. 21, pp 33-42. Print.

Ryan, M. & Deci, E., 2001. "On Happiness and Human Potentials: A Review of Research on Hedonic and Eudaimonic Wellbeing." *Annual Review of Psychology,* Vol. 55, pp. 141-166. Print.

Ryff C., & Keyes, M., 1995. "The Structure of Wellbeing: Psychological Wellbeing Revisited." *Journal of Personality and Social Psychology.* Vol. 69(4) pp. 719-727. Print.

Saith, R. & Harriss, B., 1998. *Gender Sensitivity of Wellbeing Indicators.* Discussion Paper No. 95, Switzerland: United Nations Research Institute for Social Development. Available online: http://www.unrisd.org/unrisd/website/document.nsf/d2a23ad2d50cb2a280256eb300385855/2e3f47202fad83dc80256b67005b6ff2/$FILE/dp95.pdf

Samman, E., 2007. Psychological and Subjective Wellbeing: *A Proposal for Internationally Comparable Indicators.* Oxford:University of Oxford. Print.

Sanjeewanie, K.I.H., de Silva, N. & Shivakumaran, S., 2012. *Multi-dimensional Poverty Among Samurdhi Welfare Recipients in Badulla District, Sri Lanka.* PMMA Working Paper 2012-03. Canada: Partnership for Economic Policy. Print.

Schimmack, U., 2009. "Wellbeing: Measuring Wellbeing in the SOEP." *Schmollers Jahrbuch 129: Journal of Applied Social Science Studies.* pp. 1–9.

Sen, A., 1999. *Development as Freedom.* Oxford: Oxford University Press. Print.

Sen, A., 2003. "Development as Capability Expansion" in Fukuda-Parr, S., & Shiva Kumar, A.K., *Readings in Human Development.* Oxford: Oxford University Press. Print.

Sen, A., 1985. "Wellbeing, Agency and Freedom: The Dewey Lectures 1984." *The Journal of Philosophy.* Vol. 82(4) pp.169-221. Print.

Steger, M.F., Frazier, P., Oishi, S. & Kaler, M., 2006. The Meaning in Life Questionnaire: Assessing the Presence of and Search for Meaning in Life, *Journal of Counseling Psychology,* American Psychological Association, Vol. 53(1) pp. 80–93. Print.

Steger, M., in press. "Assessing Meaning and Quality Of Life," in Geissinger, K., (ed.) APA *Handbook of Testing and Assessment in Psychology,* Washington DC: American Psychological Association. Print.

Steger, M. F., Oishi, S., & Kesebir, S., 2011. "Is a Life without Meaning satisfying? The Moderating Role of the Search for Meaning in Satisfaction with Life Judgments." *Journal of Positive Psychology.* Vol. 6 pp. 173-180. Print.

Stevenson, B. & Wolfers, J., 2009. "The Paradox of Declining Female Happiness.", *American Economic Journal: Economic Policy 2009.* Vol. 1(2) pp.190–225. Print.

Umberson, D., Slaten, E., Hopkins, K., House, J.S., & Chen, M.D, 1996. "The Effect of Social Relationships on Psychological Wellbeing: Are Men and Women Really so Different." *American Sociological Review.* Vol. 61(5) pp. 837-857. Print.

Waterman, A.S., Schwartz, S.J., & Conti. R., 2008. "The Implications of Two Conceptions of Happiness (Hedonic Enjoyment and Eudaimonia) for the Understanding of Intrinsic Motivation." *Journal of Happiness Studies.* Vol. 9(1) pp 41-79. Print.

## ඇමුණුම් 1 : මනෝවිද්‍යාත්මක සුභ සාධනය පිළිබඳ විචල්‍යයන් - දර්ශකයන්/ විචල්‍යයන්/ මිනුම් දඬු ලෙස සංයුක්ත ලෙස සකස් කර ගැනීම සඳහා අනුගමනය කළ ක්‍රියා පිළිවෙල

| දර්ශක | | විචල්‍යයන් | විචල්‍යයන්හි ඌණතාවයන් මැනීම සඳහා තෝරා ගැනීමේ පදනම | දර්ශකයන් පිළිබඳ ඌණතාවය මැනීම සඳහා තෝරාගැනීමේ පදනම | | මිනුම් දඬුවල ඌණතාවය පිළිබඳ තෝරා ගැනීමේ පදනම |
|---|---|---|---|---|---|---|
| ජීවිතයේ අරුත / වැදගත්කම | | ජීවිතයේ පැහැදිලි අරුතක් හෝ අරමුණක් නැත. | සාධක විශ්ලේෂණය භාවිතයෙන් පිළිතුර සම්පූර්ණයෙන් සත්‍ය නොවන හෝ තරමක් දුරට සත්‍ය වන අවස්ථාවල ඌණතාවයක් ඇත. | සාධක විශ්ලේෂණය භාවිතයෙන් ජීවිතයේ අරුත පිළිබඳ පැහැදිලි අවබෝධයක් නැතිකම තෘප්තිමත්භාවය පිළිබඳ අරුත නොදැනීම හෝ හැඟීමක් නැති කම - ජීවිතයේ අරුත පිළිබඳ ඌණතාවයක් ඇත. | | සාධක විශ්ලේෂණය භාවිතයෙනි.<br><br>ජීවිතයේ අරුත පිළිබඳ හෝ ආත්ම නිර්ණයනය/ ස්වයං අධිෂ්ඨානය පිළිබඳ ඌණතායක් දක්වන්නේ නම් -<br><br>මනෝවිද්‍යාත්මක සුභසාධනයේ ඌණතාවයක් ඇත. |
| | | ජීවිතයේ අරුත පිළිබඳ තෘප්තිමත්භාවයක් සොයාගත නොහැකි විය. | | | | |
| | | ජීවිතයට අරුතක් ලබා දෙන්නේ කුමක් නිසාද යන බව පිළිබඳ පැහැදිලි හැඟීමක් නැත. | | | | |
| ආත්ම නිර්නයනය/ ස්වයං අධිෂ්ඨානය | ස්වාධීනත්වය | ජීවිතයේ ඉදිරියට ගෙන යා හැක්කේ කෙසේ දැයි යන බව තීරණය කිරීමේ නිදහසක් නැත. | සාධක විශ්ලේෂණය භාවිතයෙන් පිළිතුර සම්පූර්ණයෙන් සත්‍ය නොවූ හෝ තරමක් දුරට සත්‍ය වූ විට ඌණතාවයක් ඇත. | සාධක විශ්ලේෂණය භාවිතයෙන් තම ජීවිතයේ මෙහෙයවීම සඳහා ස්වාධීනත්වයක් නැති වීම, අදහස් හා මතවාද ප්‍රකාශ කිරීමට ස්වාධීනත්වයක් නොමැතිවීම හෝ තමා පිළිබඳ අවංක වීමට ස්වාධීනත්වයක් නැතිකම ස්වාධීනත්වය පිළිබඳ ඌණතාවයක් ඇත. | සාධක විශ්ලේෂණය භාවිතයෙනි.<br><br>ස්වාධීනත්වය නිපුනතාවය හෝ සබඳතා පිළිබඳ ඌණතාවයක් දක්වන්නේ නම් ආත්ම නිර්නයනය / ස්වයං අධිෂ්ඨානය පිළිබඳ ඌණතාවයක් ඇත. | |
| | | ස්වාධීන අදහස් හා මතවාද ප්‍රකාශ කිරීමට නිදහසක් නැත . | | | | |
| | | තමා පිළිබඳ අවංක භාවයක් නොහැගේ. | | | | |
| | හැකියාව/ කුසලතාවය | තමා සිදු කරන දේ පිළිබඳ නිපුනතාවක් තමාට ඇති බව අනෙක් පුද්ගලයන්ට නොහැගේ. | | සාධක විශ්ලේෂණය භාවිතයෙන් පවසන ලද නිපුනතාවක් නැතිකම, හැකියාවන් සම්පාදනය කිරීමට හෝ එම කුසලතාවය නොමැතිබව - නිපුනතාවයෙහි ඌණතාවයක් ඇත. | | |
| | | නිපුනත්වයක් ඇති බව නොහැගේ. | | | | |
| | | සාමාන්‍යයෙන් හැකියාවක් ඇති බව නොහැගේ. | | | | |
| | සබඳතා ඇති බව | තමාට මුණ ගැසෙන පුද්ගලයන් සමග සබඳතා නොපවත්වයි. | | සාධක විශ්ලේෂණය භාවිතයෙනි පුද්ගලයන් සමග සාමූහික සබඳතා පැවැත්වීම හෝ සබඳතා නිසා රැකවරණය සැලසීම යන කරුණු වලින් ඌණතාවයක් ඇත. | | |
| | | තමා නිතර සබඳකම් පවත්වන පුද්ගලයන් සමග ළඟින් ඇසුරු කිරීමට නොපෙළඹේ. | | | | |
| | | තම ජීවිතයට සම්බන්ධ පුද්ගලයන් තමා පිළිබඳව සැලකිල්ලක් නොදක්වන බව හැගේ. | | | | |

## ඇමුණුම් 2: පුද්ගල නිශ්‍රිත සුභ සාධනය සම්බන්ධ විචල්‍යයන් - දර්ශකයන් හා මානයන් වශයෙන් සංයුක්ත කිරීමට අනුගමනය කළ ක්‍රියා පිළිවෙළ

| දර්ශක | | විචල්‍යයන් | විචල්‍යයන්හි ඌණතාවයන් මැනීම සඳහා තෝරා ගැනීමේ පදනම | දර්ශකයන් පිළිබඳ ඌණතාවය මැනීම සඳහා තෝරාගැනීමේ පදනම | | මිනුම් දඬුවල ඌණතාවය පිළිබඳ තෝරා ගැනීමේ පදනම |
|---|---|---|---|---|---|---|
| සතුට | | | සාධක විශ්ලේෂණය භාවිතයෙන් සිදු කරන ලදී. පිළිතුර පූර්ණ තෘප්තිමත් බවක් නොමැති විට හෝ බොහෝ දුරට භාවිතයෙන් නොමැති වීම. ඌණතාවක් ඇති ලෙස සලකන ලදී. | | | සාධක විශ්ලේෂණය භාවිතයෙනි. ජීවිතයේ තෘප්තිමත්භාවයෙන් හෝ සතුට හීන වී ඇත්නම් පුද්ගල නිශ්‍රිත සුභ සාධනයන් ඌණතාවයන් ඇති ලෙස සලකන ලදී. |
| ආත්ම නිර්ණායනය/ ස්වයං අධිෂ්ඨානය | ජීවිතයේ පූර්ණ තෘප්තිමත් බව | | සාධක විශ්ලේෂණය භාවිතයෙන් සිදු කරන ලදී. පිළිතුර කිසි සේත් සතුටක් නැති බව හෝ බොහෝ දුරට සතුටක් නැති වීම ඌණතාවක් ලෙස සලකන ලදී. | | | |
| | ජීවිතයේ එක් එක් අංශ පිළිබඳ තෘප්තිමත් භාවය | අධ්‍යාපනය | සාධක විශ්ලේෂණය භාවිතයෙන් පිළිතුර ඉතා සතුටු හෝ කිසි ලෙසකින් සතුටු නොවේ නම් එය ඌණතාවයක් ලෙස සලකන ලදී. | සාධක විශ්ලේෂණය භාවිතයෙන් අධ්‍යාපනය, නිවාස ,ආදායම හෝ වැඩ පිළිබඳ ඌණතාවයක් දක්වන්නේ නම් එය මූලික අවශ්‍යතාවල ඌණතාවයක් ලෙස සලකන ලදී. | සාධක විශ්ලේෂණය භාවිතයෙන් සම්ස්ථ ජීවිතයේ තෘප්තිමත්භාවය හෝ සෞඛ්‍යය, ජාලයන් ආහාර, මානසික සුභ සාධනය හෝ මූලික අවශ්‍යතා හෝ ස්ථානීය ආරක්ෂාව පිළිබඳ ඌණතාවයක් ඇත්නම් එය ජීවිතයේ තෘප්තිමත්භාවයේ ඌණතාවයක් ලෙස සලකන ලදී. | |
| | | නිවාස | | | | |
| | | ආදායම | | | | |
| | | කාර්යයන්/රැකියාව | | | | |
| | | සෞඛ්‍යය | | සාධක විශ්ලේෂණය භාවිතයෙන් සෞඛ්‍යය, මිතුරන්, පවුලේ අය ,අසල්වාසීන් පිළිබඳ හීනතාවයක් දක්වන්නේ නම් සමාජ ජාලයන් සහ සෞඛ්‍යය ඌණතාවයක් ලෙස සලකන ලදී. | | |
| | | මිතුරන් | | | | |
| | | පවුල | | | | |
| | | අසල්වාසීන් | | | | |
| | | ආහාර | | සාධක විශ්ලේෂණය භාවිතයෙන් ආහාර නිදහසේ තෝරා ගැනීමේ හෝ තම ජීවිත හසුරුවා ගැනීම පිළිබඳව ගෞරවය, අනෙක් අයට උදව් කිරීමේ හැකියාව හෝ ආධ්‍යාත්මික/ ආගමික හෝ දර්ශනවාදී චින්තනයන් පිළිබඳව ඌණතාවයක් දක්වන්නේ නම් එය මානසික සුභ සාධනය සහ ආහාර වල ඌණතාවයක් ලෙස පිළිගැනේ. | | |
| | | ස්වාධීන තෝරාගැනීම් සහ තම ජීවිතය හසුරුවා ගැනීමේ හැකියාව | | | | |
| | | ගෞරවනීය බව | | | | |
| | | අනුන්ට උදව් කිරීමේ හැකියාව | | | | |
| | | අධ්‍යාපනික/ආගමික හෝ දාර්ශනික විශ්වාස | | | | |
| | | ස්ථානීය ආරක්ෂාව | | සාධක විශ්ලේෂණය භාවිතයෙන් ස්ථානීය ආරක්ෂාව පිළිබඳ ඌණතාවයක් ඇති නම් එය ස්ථානීය ආරක්ෂාවේ ඌණතාවයක් ලෙස සලකන ලදී. | | |

### ඇමුණුම් 3: මනෝවිද්‍යාත්මක සුභ සාධනයෙහි ඌණතාවයන් දර්ශක හා විචල්‍යයන් මගින් පැහැදිලි කිරීම

### වගු අංක 1: දර්ශක මගින් හීනතාවය / ඌණතාවය මැනීම

| දර්ශකය | ඌණතාවය / හීනතාවය | පිරිමි | ගැහැණු | අපේක්ෂිත අපගමන ප්‍රමාණය | වාසි අවාසි ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| ජීවිතයේ අරුත | නැත | 67.5% | 81.2% | 0.020* | 2.0747 |
| | ඇත | 32.5% | 18.8% | | |
| ස්වාධීනත්වය | නැත | 82.8% | 84.5% | පැහැදිලි සංඛ්‍යාත්මක වෙනසක් නොපෙනේ | |
| | ඇත | 17.2% | 15.5% | | |
| නිපුණතාවය/ කුසලතාවය | නැත | 88.6% | 89.8% | පැහැදිලි සංඛ්‍යාත්මක වෙනසක් නොපෙනේ | |
| | ඇත | 11.4% | 10.2% | | |
| සබඳතාවයන් | නැත | 74.9% | 87.7% | 0.016* | 0.420 |
| | ඇත | 25.1% | 12.3% | | |
| ආත්ම නිර්ණායනය | නැත | 72.5% | 65.3% | පැහැදිලි සංඛ්‍යාත්මක වෙනසක් නොපෙනේ | |
| | ඇත | **34.7%** | **27.5%** | | |
| මනෝවිද්‍යාත්මක සුභ සාධනය | නැත | 64.9% | 51.1% | 0.039* | 0.506 |
| | ඇත | **48.9%** | **35.1%** | | |

* වාසි අවාසි ප්‍රතිශතය පිළිබඳ අපේක්ෂිත අපගමන මට්ටම 0.05

### වගු අංක 2: විචල්‍යයන් මගින් හීනතාවය / ඌණතාවය මැනීම

| දර්ශක | | විචල්‍යය | පිරිමි | ගැහැණු | අපේක්ෂිත අපගමන ප්‍රමාණය | වාසි අවාසි ප්‍රතිශකය |
|---|---|---|---|---|---|---|
| ජීවිතයේ අරුත | | ජීවිතයේ පැහැදිලි අරුතක් හෝ අරමුණක් නැත. | 21.7% | 9.3% | .012* | .369 |
| | | ජීවිතයේ අරුත මුණ නොගැසුනි. | 24.5% | 10.6% | .007* | .368 |
| | | ජීවිතයේ අරුත ලබාදෙන්නේ කුමකින් දැයි පැහැදිලි අවබෝධයක් නැත. | 20.4% | 8.6% | .014* | .368 |
| | | සංයුතිය | 32.5% | 18.8% | .022** | 2.075 |
| ආත්ම නිර්ණායනය | ස්වාධීනත්වය | තම ජීවිතය මෙහෙයවීම සම්බන්ධ තීරණ ගැනීමට නිදහස් හැකියාවක් නැත. | 9.5% | 10.6% | සංඛ්‍යාන විද්‍යාත්මකව පැහැදිලි වෙනසක් නැත | |
| | | තම අදහස් හා මතයන් ප්‍රකාශ කිරීමේ නිදහස් හැකියාවක් නැත. | 6.0% | 11.1% | | |
| | | තමා අවංක විය යුතු බව නොහැඟේ. | 6.6% | 13.4% | | |
| | | සංයුතිය | 17.2% | 15.5% | | |
| | නිපුණත්වය / කුසලතාවය | තමාට නිපුණත්වයක් ඇති බව අනිත් පුද්ගලයන්ට නොහැඟේ. | 7.6% | 4.4% | සංඛ්‍යාන විද්‍යාත්මකව පැහැදිලි වෙනසක් නැත | |
| | | යමක් සිදු කිරීමට නිපුණතාවයක් ඇති බවට හැඟීමක් අවබෝධයක් නැත. | 7.8% | 3.0% | | |
| | | සාමාන්‍යයෙන් හැකියාවක් ඇති බව නොහැඟේ. | 4.7% | 6.6% | | |
| | | සංයුතිය | 11.4% | 10.2% | | |
| | සබඳතාවය | තමාට මුණ ගැසෙන පුද්ගලයන් සමග සබඳතාවයක් නොපවත්වයි. | 9.0% | 4.2% | සංඛ්‍යාන විද්‍යාත්මකව පැහැදිලි වෙනසක් නැත | |
| | | තමාට නිරන්තරයෙන් මුණගැසෙන පුද්ගලයන් සමග සුහද සබඳතා පැවැත්වීමට හැඟීමක් නැත. | 12.3% | 7.0% | | |
| | | තමාට රැකවරණය සලසන පුද්ගලයින් පිළිබඳ හැඟීමක් නැත. | 15.3% | 7.5% | | |
| | | සංයුතිය | 25.1% | 12.3% | .016* | 2.383 |
| | සංයුතිය | | 34.7% | 27.5% | සංඛ්‍යාන විද්‍යාත්මකව පැහැදිලි වෙනසක් නැත | |
| මනෝවිද්‍යාත්මක සුභ සාධනය | | සංයුතිය | 48.9% | 35.1% | .039* | 1.767 |

* අපේක්ෂිත අපගමන මට්ටම 0.05

## වගු අංක 3: ප්‍රතිගමන විශ්ලේෂණ ප්‍රතිඵල

| තීරණ ගැනීමේ විචල්‍යයන් | එක් එක් අනාවැකි වල අපේක්ෂිත අපගමනය | | | | | | | සම්භාවිතා අනුපාතය පිළිබඳ පරීක්ෂණ | R2 ප්‍රතිගමනය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අනාවැකි අපේක්ෂිත තත්වය | B | S.E. B | Wald Chi-Square | df | Sig. | Exp(B) සම්භාවිතා අනුපාතය | Log likelihood | Cox & Snell | Nagelkerke |
| **ජීවිතයේ අරුත** | | | | | | | | | | |
| සතුට ඌණ වේ. (ඔව් = 1, නැත = 0) | ජීවිතයේ අරුත ඌණ වේ. (ඔව් = 1, නැත = 0) | 1.153 | .453 | 6.481 | 1 | .011* | 3.167 | 140.534a | .028 | .057 |
| | ස්ථිර / ස්ථායි වේ. | -2.570 | .301 | 72.736 | 1 | .000 | .077 | | | |
| ජීවිතයේ තෘප්තිමත් බව ඌණ වේ. (ඔව් = 1, නැත = 0) | ජීවිතයේ අරුත ඌණ වේ. (ඔව් = 1, නැත = 0) | 1.641 | .493 | 11.068 | 1 | .001* | 5.159 | 120.003a | .049 | .110 |
| | ස්ථිර / ස්ථායි වේ. | -2.999 | .365 | 67.638 | 1 | .000 | .050 | | | |
| ස්ත්‍රී පුරුෂ භාවය (පුරුෂ = 1, ස්ත්‍රී = 0) | ජීවිතයේ අරුත ඌණ වේ. (ඔව් = 1, නැත = 0) | .730 | .315 | 5.377 | 1 | .020* | 2.075 | 301.295a | .024 | .033 |
| | ස්ථිර / ස්ථායි වේ. | -.357 | .157 | 5.144 | 1 | .023 | .700 | | | |
| **ආත්ම නිර්ණයනය** | | | | | | | | | | |
| සතුට ඌණ වේ. (ඔව් = 1, නැත = 0) | ආත්ම නිර්නායකය ඌණ වේ. (ඔව් = 1, නැත = 0) | .873 | .448 | 3.800 | 1 | .051 | 2.394 | 143.138a | .017 | .034 |
| | ස්ථිර / ස්ථායි වේ. | -2.512 | .306 | 67.590 | 1 | .000 | .081 | | | |
| ජීවිතයේ තෘප්තිමත් බව ඌණ වේ. (ඔව් = 1, නැත = 0) | ආත්ම නිර්නායකය ඌණ වේ. (ඔව් = 1, නැත = 0) | 1.456 | .485 | 9.019 | 1 | .003* | 4.288 | 126.167a | .041 | .090 |
| | ස්ථිර / ස්ථායි වේ. | -2.951 | .371 | 63.292 | 1 | .000 | .052 | | | |
| ස්ත්‍රී පුරුෂ භාවය (පුරුෂ = 1, ස්ත්‍රී = 0) | ආත්ම නිර්නායකය ඌණ වේ. (ඔව් = 1, නැත = 0) | .335 | .291 | 1.321 | 1 | .250 | 1.397 | 306.054a | .006 | .008 |
| | ස්ථිර / ස්ථායි වේ. | -.281 | .163 | 2.980 | 1 | .084 | .755 | | | |
| **මනෝවිද්‍යාත්මක සුභසාධනය** | | | | | | | | | | |
| සතුට ඌණ වේ. (ඔව් = 1, නැත = 0) | මනෝවිද්‍යාත්මක සුභසාධනය ඌණ වේ. (ඔව් = 1, නැත = 0) | 1.245 | .474 | 6.895 | 1 | .009* | 3.473 | 139.058a | .033 | .069 |
| | ස්ථිර / ස්ථායි වේ. | -2.836 | .384 | 54.591 | 1 | .000 | .059 | | | |
| ජීවිතයේ තෘප්තිමත් බව ඌණ වේ. (ඔව් = 1, නැත = 0) | මනෝවිද්‍යාත්මක සුභසාධනය ඌණ වේ. (ඔව් = 1, නැත = 0) | 1.705 | .562 | 9.211 | 1 | .002* | 5.504 | 119.797a | .049 | .110 |
| | ස්ථිර / ස්ථායි වේ. | -3.347 | .485 | 47.541 | 1 | .000 | .035 | | | |
| ස්ත්‍රී පුරුෂ භාවය (පුරුෂ = 1, ස්ත්‍රී = 0) | මනෝවිද්‍යාත්මක සුභසාධනය ඌණ වේ. (ඔව් = 1, නැත = 0) | .569 | .276 | 4.270 | 1 | .039 | 1.767 | 301.628a | .019 | .026 |
| | ස්ථිර / ස්ථායි වේ. | -.387 | .179 | 4.673 | 1 | .031 | .679 | | | |

* අපේක්ෂිත අපගමන මට්ටම 0.05

### ඇමුණුම් 4: පුද්ගල නිශ්‍රිත සුභ සාධනය සම්බන්ධ දර්ශක සහ විචල්‍ය මගින් ඌණතාවය මැනීම

### වගු අංක 1: දර්ශක මගින් ඌණතාවය මැනීම

| දර්ශකය | ඌණතාවය / හීනතාවය | පිරිමි | ගැහැණු | අපේක්ෂිත අපගමනය | සම්භාවිතා අනුපාතය |
|---|---|---|---|---|---|
| සතුට | නැත | 93.00% | 87.60% | සංඛ්‍යාන විද්‍යාත්මකව පැහැදිලි වෙනසක් නැත. | |
| | ඇත | 7.00% | 12.40% | | |
| පූර්ණ ජීවිත තෘප්තිමත්භාවය | නැත | 90.10% | 92.00% | සංඛ්‍යාන විද්‍යාත්මකව පැහැදිලි වෙනසක් නැත. | |
| | ඇත | 9.90% | 8.00% | | |
| එක් එක් සුවිශේෂී අංශ පිළිබඳ තෘප්තිමත්භාවය | නැත | 44.10% | 51.30% | සංඛ්‍යාන විද්‍යාත්මකව පැහැදිලි වෙනසක් නැත. | |
| | ඇත | 48.07% | 55.90% | | |
| ජීවිත තෘප්තිය (සංයුතිය) (පූර්ණ + ආංශික) | නැත | 43.20% | 50.30% | සංඛ්‍යාන විද්‍යාත්මකව පැහැදිලි වෙනසක් නැත. | |
| | ඇත | **56.80%** | **49.70%** | | |
| පුද්ගල නිශ්‍රිත සුභසාධක පිළිබඳ සංයුතිය | නැත | 87.6% | 91.9% | සංඛ්‍යාන විද්‍යාත්මකව පැහැදිලි වෙනසක් නැත. | |
| | ඇත | 12.4% | 8.1% | | |

* වාසි අවාසි අනුපාතය පිළිබඳ අපේක්ෂිත අපගමන මට්ටම 0.05

### වගු අංක 2 : විචල්‍ය මගින් ඌණතාවය මැනීම

| දර්ශක | | විචල්‍යය | පිරිමි | ගැහැණු | අපේක්ෂිත අපගමනය | වාසි අවාසි ප්‍රතිශකය |
|---|---|---|---|---|---|---|
| සතුට | | | 7.0% | 12.4% | සංඛ්‍යාන විද්‍යාත්මකව පැහැදිලි වෙනසක් නැත. | |
| ජීවිතයේ තෘප්තිමත් භාවය | ජීවිතයේ පූර්ණ තෘප්තිමත් භාවය | | 9.9% | 8.0% | සංඛ්‍යාන විද්‍යාත්මකව පැහැදිලි වෙනසක් නැත. | |
| | එක් එක් අංශ පිළිබඳ තෘප්තිමත් භාවය | අධ්‍යාපනය | 26.4% | 31.9% | සංඛ්‍යාන විද්‍යාත්මකව පැහැදිලි වෙනසක් නැත. | |
| | | නිවාස | 20.2% | 22.4% | | |
| | | ආදායම | 29.4% | 35.5% | | |
| | | කාර්යයන් | 9.9% | 11.7% | | |
| | | සෞඛ්‍යය | 10.6% | 23.1% | .016* | .395 |
| | | මිතුරන් | 14.1% | 5.0% | .023* | 3.146 |
| | | පවුල | 6.3% | 5.6% | සංඛ්‍යාන විද්‍යාත්මකව පැහැදිලි වෙනසක් නැත. | |
| | | අසල්වාසීන් | 11.9% | 8.5% | | |
| | | ආහාර | 7.2% | 6.4% | | |
| | | තම ජීවිතය පිළිබඳ ස්වාධීනව තෝරා ගැනීමේ හා පාලනය කිරීමට හැකියාව | 4.4% | 10.5% | | |
| | | ගෞරවනීයත්වය | 6.0% | 7.5% | | |
| | | අනුන්ට උදව් කිරීමේ හැකියාව | 7.2% | 5.5% | | |
| | | අධ්‍යාත්මික/ ආගමික දර්ශනවාදී විශ්වාස | .0% | 1.9% | | |
| | | ස්ථානීය ආරක්ෂාව | 7.4% | 9.2% | | |
| | | සංයුතිය | 48.7% | 55.9% | | |
| | | සංයුතිය | 49.7% | 56.8% | සංඛ්‍යාන විද්‍යාත්මකව පැහැදිලි වෙනසක් නැත. | |
| පුද්ගල නිශ්‍රිත සුභසාධනය | | සංයුතිය | 8.1% | 12.4% | සංඛ්‍යාන විද්‍යාත්මකව පැහැදිලි වෙනසක් නැත. | |

* වාසි අවාසි අනුපාතය පිළිබඳ අපේක්ෂිත අපගමන මට්ටම 0.05

### වගු අංක 3 : ප්‍රතිගමන විශ්ලේෂණ ප්‍රතිඵල

| තීරණ ගැනීමේ විචල්‍යයන් | එක් එක් අනාවැකි වල අපේක්ෂිත අපගමනය | | | | | | | සම්භාවිතා අනුපාතය පිළිබඳ පරීක්ෂණ | R2 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අනාවැකි | B | S.E. B | Wald Chi-Square | df | Sig. | Exp(B) සම්භාවිතා අනුපාතය | Log likelihood | Cox & Snell | Nagelkerke |
| **ජීවිත තාප්තිමත්භාවය** | | | | | | | | | | |
| සතුටෙහි ඌණතාවය (ඔව් = 1, නැත = 0) | ජීවිතයේ සතුට ඌණ වේ (ඔව් = 1, නැත = 0) | 1.554 | .573 | 7.367 | 1 | .007* | 4.731 | 137.257a | .042 | .086 |
| | ස්ථිර / ස්ථායි වේ | -3.229 | .514 | 39.388 | 1 | .000 | .040 | | | |
| ස්ත්‍රී පුරුෂ භාවය (පිරිමි = 1, ගැහැණු = 0) | ජීවිතයේ තෘප්තිමත් භාවය ඌණ වේ (ඔව් = 1, නැත = 0) | -.288 | .271 | 1.134 | 1 | .287 | .749 | 304.716a | .005 | .007 |
| | ස්ථිර / ස්ථායි වේ | -.047 | .197 | .058 | 1 | .810 | .954 | | | |
| **පුද්ගල ආශ්‍රිත සුභසාධනය** | | | | | | | | | | |
| ස්ත්‍රී පුරුෂ භාවය (පිරිමි = 1, ගැහැණු = 0) | පුද්ගල නිශ්චිත සුභසාධනය ඌණ වේ. (ඔව් = 1, නැත = 0) | -.473 | .451 | 1.097 | 1 | .295 | .623 | 314.203a | .005 | .007 |
| | ස්ථිර / ස්ථායි වේ | -.145 | .140 | 1.073 | 1 | .300 | .865 | | | |

* අපේක්ෂිත අපගමන මට්ටම 0.05

### ඇමුණුම් 5 : ජීවිතයේ තාප්තිමත්භාවය පිළිබඳ කුමින් ඉදිරිපත් කළ අංශ 07

| අංශය | රුචිකත්වය දක්වන අයිතමය / කරුණ |
|---|---|
| ද්‍රව්‍යමය සුභසාධනය | ආහාර / නිවාස / ආදායම් |
| සෞඛ්‍යය | සෞඛ්‍යය |
| කාර්යක්ෂමතාවය | කාර්යයන් / වැඩ |
| ආරක්ෂාව | භෞතික ආරක්ෂාව |
| ඉතා සමීප බව | මිතුරන් සහ පවුලේ අය |
| ප්‍රජාව | අසල්වාසීන් / අධ්‍යාපනය / ක්‍රියාකාරීව අනුන්ට උපකාර කිරීමේ හැකියාව |
| චිත්තවේගී / සංවේදී සුභ සාධනය | ආධ්‍යාත්මික, ආගමික හෝ දර්ශනවාදී විශ්වාස |



සුබසාධනය නම් සංකල්පය හුදෙක් ද්‍රව්‍යමය සුබසාධනය පමණක් ලෙස තේරුම් නොගත යුතු බවට ඇති අවබෝධය ඉහළ යමින් තිබේ. එයට හේතුව ද්‍රව්‍යමය නොවන සුබසාධනය හෙවත් මානසික සුබසාධනය භෞතික සුබසාධනයේ අවසන් ප්‍රතිඵලය වීමයි. ඒ ආකාරයටම, බොහෝ විට, සතුට හා සුබසාධනය සංවර්ධනයේ අවසන් අරමුණු ලෙස සැලකේ. ඉතාම පහත් ආදායම් මට්ටම්වලදී හැර ආදායම හා සතුට අතර සම්බන්ධයක් නැති බව සමීක්ෂණ මගින් පෙන්වා දී තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස පර්යේෂකයන් හා ප්‍රතිපත්ති සම්පාදකයන් අතර සුබසාධනයේ ද්‍රව්‍යමය නොවන මානයන් පිළිබඳ උනන්දුව වර්ධනය වෙමින් තිබේ. ආදායම හා පරිභෝජනය, සුබසාධනය මැනීමෙහිලා අප්‍රමාණවත් මිනුම් ය යන කරුණ විසින් සුබසාධනය සෘජුව මැනීමේ ක්‍රම කෙරෙහි ප්‍රාමාණික උනන්දුවක් ඇති කර තිබේ. එම නිසා දරිද්‍රතාව පිළිබඳ බහුමානීය සංසිද්ධිය හා අදාළව, මානසික සුභසාධනය වැදගත් මානයක් ලෙස වැඩියෙන් සැලකිල්ලට ලක් වෙන්නට පටන් ගෙන තිබේ.

මානසික සුබසාධනය වැනි දීර්ඝ කාලයක් තුළ පරිණාමය වූ, ආර්ථික දර්ශකවල සිට සමාජ හා මනෝ විද්‍යාත්මක දර්ශක දක්වා වන දරිද්‍රතාව හා සම්බන්ධ අදාළ දර්ශක, බහුමානීය දරිද්‍රතා විශ්ලේෂණ විසින් හඳුනාගෙන තිබේ. එහෙත්, දිළිඳුකමේ සංකීර්ණත්වය තේරුම් ගැනීම සඳහා ජාත්‍යන්තර වශයෙන් සංසන්දනය කළ හැකි පුද්ගල හා ගෘහ මට්ටමේ දත්තවල අඩුවක් තවමත් තිබේ.

ඔක්ස්ෆර්ඩ් දිළිඳුකම හා මානව සංවර්ධන උත්සාහයන් (OPHI) ආයතනය විසින් විෂයබද්ධ දර්ශක මෙන්ම, මනෝ විද්‍යාත්මක හා මානසික සෞඛ්‍ය දර්ශකද භාවිතා කරමින් සංවර්ධනය කරන ලද මොඩියුලයකට දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය බදුල්ල දිස්ත්‍රික්කයේදී මාර්ගෝපදේශකත්වය සැපයුවේය. මෙම සුබසාධනය පිළිබඳ මානය ශ්‍රී ලාංකික සංදර්භයට අදාළව තේරුම් ගත හැකි සරුසාර දත්ත කට්ටලයක් මෙම මොඩියුලයෙන් එළි දුටුවේය. මෙම පත්‍රිකාව විසින් එම දත්ත භාවිතා කරමින් සුබසාධනය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය අතර ඇති සම්බන්ධය සාකච්ඡා කරනු ලැබේ. එමගින් පිරිමින් හා ගැහැනුන් මානසික සුබසාධනය පිළිබඳ අත්දැකීම් ලබන ආකාරයේ ඇති කුහුල දනවන වෙනස්කම් හෙළිදරව් කෙරේ.

cepa
centre for poverty analysis
29 R G Senanayake Mawatha,
Colombo 7, Sri Lanka.
Tel: +94(011) 4690200, 2676955
Fax: +94 (011) 2676 959
E-mail: info@cepa.lk
www.cepa.lk

The Asia Foundation

ISBN 978-955-1040-70-3